# හඬ

CED ත්‍රෛමාසික පුවත් සඟරාව

CED Sri Lanka

Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව දෙවන කලාපය 2017 ජනවාරි


## අධ්‍යාපනයට පෞද්ගලික අංශයේ මැදිහත්වීම පිළිබඳව ඔබ අවදියයෙන් ද ?



පසුගිය දශක දෙකේදී විශේෂයෙන්ම දියුණුවෙමින් පවතින රටවල් වල අධ්‍යාපන ක්ෂේත්‍රයට පෞද්ගලික අංශයේ මැදිහත්වීම් ප්‍රමාණාත්මක හා අංශාත්මක වශයෙන් වර්ධනයක් දක්නට ලැබිණි. කෙසේ නමුත් වර්තමානයේදී දක්නට ලැබෙන්නේ අතීතයේදී සිදුවූවාක් මෙන් පෞද්ගලික අංශය සමාජයේ ප්‍රභූ පන්තියට අධ්‍යාපන අවස්ථාවන් සැලසීමට මැදිහත්වීම පමණක් නොවේ. අඩු ආදායම් ලබන්නාවූ ජනතාව ඉලක්කකරගත්, ලාභය පරමාර්ථය කරගත් ගුණාත්මකභාවයෙන් අඩු පෞද්ගලික පාසල් බිහිවීම පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. මෙයට අමතරව විශාල ප්‍රමාණයේ පෞද්ගලික පාසල් ජාලයන් සඳහා සිදුකරන ආයෝජනයන්ගේ ඉහළ යාම, පෞද්ගලික අමතර පන්ති සංඛ්‍යාව ඉහළයාම, රජයේ අධ්‍යාපන අංශයේ කළමනාකරණ කටයුතු පෞද්ගලික අංශයට පැවැරීම වැනි ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතිනු නිරීක්ෂණය කළ හැකිවේ.

පාසල් අධ්‍යාපනය සම්පූර්ණයෙන් පෞද්ගලිකකරණය කිරීමට සැලසුම් කර ඇති රටවල් පිලිබඳවද වාර්තා වේ. 2016 මුල්භාගයේදී ලයිබීරියාව සමස්ථ අධ්‍යාපන පද්ධතියම බාහිර සහ පෞද්ගලික අංශයට පැවැරීමට අදහස් කරන බව දැනුම් දුන්නේය. මෙහිදී රාජ්‍ය සහ පෞද්ගලික

පාසල් අධ්‍යාපනය සම්පූර්ණයෙන් පෞද්ගලිකකරණය කිරීමට සැලසුම් කර ඇති රටවල් පිලිබඳවද වාර්තාවේ. 2016 මුල්භාග යේදී ලයිබීරියාව සමස්ථ අධ්‍යාපන පද්ධතියම බාහිර සහ පෞද්ගලික අංශයට පැවැරීමට අදහස් කරන බව දැනුම් දුන්නේය. මෙහිදී රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරණයක් තුළින් පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් පද්ධතියම පෞද්ගලික අංශයට පැවැරීමක් සිදුවේ.

අංශයේ පාර්ශවකරණයක් තුළින් පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් පද්ධතියම පෞද්ගලික අංශයට පැවැරීමක් සිදුවේ. මෙම වැඩ පිළිවෙළ හඳුන්වනු ලබන්නේ "ලයිබීරියාවේ පාර්ශවකරණ පාසල් ව්‍යාපෘතිය' යනුවෙනි. මුල් සැලැස්මට අනුව පාසල් වලින් බහුතරයත් ලාභය පරමාර්ථ කරගත් බ්‍රිජ් ඉන්ටර් නැෂනල් ඇකඩමි යන පෞද්ගලික අධ්‍යාපන ආයතනයට බාර දීමට නියමිතව පැවැතිනි. එම ආයතනය සමග අත්සන් කරනු ලබන ඩොලර් මිලියන 65 වටිනාකමකින් යුත් කොන්ත්‍රාත්තුවකට අනුව වසර 5 ක කාලසීමාවක් සඳහා පාසල් කළමනාකරණය ඔවුන්ට පැවරීමට නියමිතව තිබිණි. නමුත් මේ සම්බන්ධයෙන් පැමිණි විවේචන හමුවේ පළමු අදියරේදී පාසල් 92 ක් පෞද්ගලික ආයතන ගණනාවකට බාරදීමට තීරණය කරන ලදී.

ආසියා සහ පැසිෆික් කළාපයේ අධ්‍යාපනය පෞද්ගලිකකරණය වීමේ උපනතිය ලාභ උපයන පෞද්ගලික පාසල් රාශියක් බිහිවීම, අධ්‍යාපන අංශයේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරණය ව්‍යාප්තවීම සහ වර්ධනයවීම තුලින් මනාව පැහැදිලිවේ. ආසියානු කළාපයේ රටවල් බොහොමයක අඩු ගාස්තු අය කරන පුද්ගලික අංශයේ පාසල් බිහිවී ඇත. දකුණු ආසියාවේ වයස අවුරුදු 6 -18 අතර ළමුන්ගෙන් තුනෙන් එකක් පෞද්ගලික අංශයේ පාසල් වල අධ්‍යාපනය ලබති. පෞද්ගලික පාසල් වල අධ්‍යාපනය ලැබීම සඳහා ලියාපදිංචිවන ළමුන් ප්‍රමාණය බංග්ලාදේශය, ඉන්දියාව, නේපාලය, පාකිස්ථානය, ශ්‍රී ලංකාව, කාම්බෝජය, පිලිපීනය, තායිලන්තය වැනි රටවල සීග්‍රයෙන් ඉහළ ගොස් ඇත.

මෙම තත්වය විවිධවූ සන්ධර්භයන්හි ඇතිකරන්නාවූ බලපෑම පිළිබඳව තක්සේරු කිරීමට පර්යේෂණ ගණනාවක් සිදුකර

3 වන පිටුවට

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්වයන් නොසලකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**

K. D පීරිස් මහතා
වජිර උමගලිය මහතා
සුභද්‍රා රාංසිංහ මහත්මිය
ලුර්දු සාමි මහතා

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය - නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සංධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැවීමට අපේක්ෂා කරනු ලබයි. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධවීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධාන වලට/පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතුවේ

- අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන පළපුරුදු සංවිධානයක් හෝ පුද්ගලයෙක් විය යුතුය
- සංවිධානයක් නම් රජයේ අදාළ ආයතනයන්හි (දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම්/සමාජ සේවා අමාත්‍යාංශය ) ලියාපදිංචි වී තිබිය යුතුය

අධ්‍යාපන සංවර්ධන සංධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර දුරකතන අංක 0112887642 ඔස්සේ අප අමතන්න නැත්නම් අපට ලියන්න අපගේ ලිපිනය

**අධ්‍යාපන සංවර්ධන සංධානය**
**අංක 439/6A**
**සුදර්ශන මාවත**
**නාවල පාර. රාජගිරිය**

## සංස්කාරක සටහන

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණු වල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන්ම අධ්‍යාපන සංවර්ධන සධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සලකන්න.

# දෘෂ්‍යාබාධිත පුද්ගලයන්ට අධ්‍යාපනයට මගහෙළිකරන තිත් හයේ රහස

ලෝකයේ පවතින අධ්‍යාපන විධික්‍රම අතර තවත් සුවිශේෂී එක් අධ්‍යාපන විධික්‍රමයක් පිළිබඳ මෙහි දී සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. දෘෂ්‍ය ආබාධ සහිත ළමුන් අධ්‍යාපනය ලබන විශේෂ අධ්‍යාපන ක්‍රමයක් වන මූලික වශයෙන් තිත් හයක් පදනම් කර ගනිමින් ඒ වටා ගෙතුනු සංකේත අක්ෂර මාලාවකින් සමන්විත " බ්‍රේල් මාධ්‍ය " පිළිබඳ මෙහි දී විමසා බලමු.

18 වන සියවස දක්වා ඈත ඉතිහාසයකට දිව යන බ්‍රේල් මාධ්‍යයේ මව් රට ලෙස ගෞරවයට පාත්‍ර වන්නේ ප්‍රංශය යි. ලොව පුරා දස දහස් සංඛ්‍යාත දෘෂ්‍යාබාධිත ළමුන්ගේ නැණ පහන් දැල්වීමට ඉවහල් වන මෙම සංකේත අක්ෂර රටාව ලොවට හඳුන්වා දුන් ශ්‍රේෂ්ඨත ම මිනිසා ලෙස සම්භාවනාවට පාත්‍ර වන්නේ ශ්‍රීමත් " ලුවී බ්‍රේල් " මහතා යි. එතුමාණන් විසින් ලොවට තිළිණ කළ මෙම මාහැඟි දායාදය හැඳින්වීම සඳහා ඔහුට කරන ලද ගෞරවයක් ලෙස "බ්‍රේල් " යන්න යොදා ගන්නා ලදී.

> 18 වන සියවස දක්වා ඈත ඉතිහාසයකට දිව යන බ්‍රේල් මාධ්‍යයේ මව් රට ලෙස ගෞරවයට පාත්‍ර වන්නේ ප්‍රංශය යි. ලොව පුරා දස දහස් සංඛ්‍යාත දෘෂ්‍යාබාධිත ළමුන්ගේ නැණ පහන් දැල්වීමට ඉවහල් වන මෙම සංකේත අක්ෂර රටාව ලොවට හඳුන්වා දුන් ශ්‍රේෂ්ටතම මිනිසා ලෙස සම්භාවනාවට පාත්‍ර වන්නේ ශ්‍රීමත් "ලුවී බ්‍රේල්" මහතා යි. එතුමාණන් විසින් ලොවට තිළිණ කළ මෙම මාහැඟි දායාදය හැඳින්වීම සඳහා ඔහුට කරන ලද ගෞරවයක් ලෙස "බ්‍රේල්" යන්න යොදා ගන්නා ලදී.

දෘෂ්‍යාබාධිත පුද්ගලයින් සඳහා ඉගෙනීමට මගක් සෙවීමට ලුවී බ්‍රේල් යොමු කළ පසුතලය පිළිබඳවත් කෙටියෙන් හෝ යමක් සඳහන් කළ යුතු ය. පාවහන් මැසීම ජීවන වෘත්තිය කර ගත් සිය පියාට දිනපතා සහය වීම ලුවී බ්‍රේල්ගේ විනෝදාංශයක් විය. දිනක් පාවහන් මසන කටුවක් ඇසේ ඇනීමෙන් ලුවී බ්‍රේල්ගේ එක් ඇසක් නොපෙනී ගිය අතර, නොබෝ දිනකින් අනෙක් ඇස ද එම ඉරණමට ම පත් විය. සිය දෑසම නොපෙනී යාමේ වේදනාව පුංචි ලුවීට එදා දරා ගැනීමට අපහසු වුවත් ටික දිනකින් සිත ශක්තිමත් කරගත් ඔහු පාවහන් මසන කටුවක් හා සම් කැබැල්ලක් ගෙන කටුවෙන් සම් කැබැල්ල මත සිදුරු කරන්නට විය. මෙම ක්‍රියාවලිය දින කිහිපයක් කිරීම තුළින් දෑස් නොපෙනෙන පුද්ගලයින්ට ස්පර්ෂය තුළින් අකුරු කළ හැකි බව ලුවී බ්‍රේල් අවබෝධ කර ගන්නා ලදී. ආරම්භයේ දී තිත් අටකින් සමන්විත වූ මෙම සංකේත අක්ෂර රටාව යුධ සමයේ දී ප්‍රංශ ආරක්ෂක අංශය විසින් රහස් ඔත්තු සේවාවක් ලෙස ද භාවිතා කළ බව සඳහන් වේ. කෙසේ වෙතත් ලුවී බ්‍රේල් විසින් සොයා ගන්නා ලද තිත් අටකින් යුත් බ්‍රේල් මාධ්‍ය වර්තමානය වන විට තිත් හයක් දක්වාත්, භාෂා දහ අටක් දක්වාත් පරිවර්තනය වී තිබේ.

**6 වන පිටුවට**

1 වන පිටුවෙන්

තිබේ. මෙම පර්යේෂණ සිදුකළ විවිධ පර්යේෂකයින් මේ ආකාරයට පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන බිහිවීම තුලින් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතියට සිදුවන්නාවූ බලපෑම පිලිබඳව බලවත් අවධානය යොමුකර ඇත. අධ්‍යාපන අයිතිය සම්බන්ධයෙන් වන එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා 2014 ඔක්තෝබර් තම වාර්තාවෙන් දක්වා ඇත්තේ "නොබෝ දිනකින් පෞද්ගලික අධ්‍යාපනය රජය මගින් ලබාදෙන අධ්‍යාපනය වැඩිදියුණු කරනවා නොව රජයේ අධ්‍යාපන වෙනුවට පවතින එකක් බවට පත්වන බව සඳහන් කිරීම අතිශෝක්තියක් නොවන" බවයි. ඔහු තවදුරටත් දක්වා සිටින්නේ අධ්‍යාපන අයිතීන් ලබානොදී කොන්කිරීමට ලක්කිරීම සහ සමාජයේ අසමානතාවයන් ඇතිකිරීම මගින් අධ්‍යාපනය ලැබීමට තිබෙන විශ්වීය අයිතිය අහිමි කරනවා මෙන්ම ආන්තීකරණයට මගපාදමින් සහ මානව හිමිකම් වල මූලික මූලධර්මයන්ට පටහැනිව ක්‍රියාකරන බවත්ය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම 2016 ජූලි 1 වැනි දා නිමාවට පත්වූ ඔවුන්ගේ 2 සැසිවාරයේදී මෙම තත්වය සැලකිල්ලට ගෙන නව යෝජනාවක් සම්මත කරගන්නා ලදී. එනම් සියලුම රටවල් අධ්‍යාපනය වාණිජකරණය වීම මගින් ඇති වන්නාවූ සියලුම සෘණාත්මක බලපෑම් සම්බන්ධයෙන් වහාම අවධානය යොමු කර ඒවාට පිළියම් යෙදිය යුතු බවය. මෙහිදී අධ්‍යාපනය ලබාදෙන ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීමට හා අධ්‍යාපනය ලැබීමේ අයිතියට සෘණාත්මක බලපෑමක් ඇති නොකරන්නා අන්දමින් වගවීමෙන් යුතුව කටයුතු කිරීමට අධ්‍යාපනය ලබාදෙන ආයතන නියාමනය කිරීම සඳහා වැඩසැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම සම්බන්ධව විශේෂයෙන් අවධාරණය කරන ලදී එසේම මේ පිළිබඳව පර්යේෂණ සිදුකිරීමට සහාය ලබාදීමට නිර්දේශ කරන ලදී. එසේම මෙම යෝජනාවෙන් රාජ්‍ය අංශය විසින් තමන් සතුව පවත්නා සම්පත් උපයෝගී කරගෙන උපරිම වශයෙන් නොමිළයේ අධ්‍යාපනය ලබාදීම සඳහා ආයෝජනය කිරීමටත් අධ්‍යාපනය වෙනුවෙන් දේශීය සහ විදේශීය අරමුදල් උපයෝගී කරගැනීම වැඩිකිරීමටත් එමගින් මහජනතාවගේ යහපත උදෙසා අධ්‍යාපනයට දායකත්වය සලසන මෙන් දැඩිව ඉල්ලා සිටින ලදී.

එක්සත් ජාතීනගේ මානව අයිතිවාසිකම් පිළිබඳ ආයතනද සමහර රටවල් සම්බන්ධයෙන් මේ හා සමාන තත්වයන් ඔවුන්ගේ සමාලෝචනයන්හි දී අනාවරණය කරගෙන ඇත. එක්සත් ජාතීන්ගේ ආර්ථික සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව පිලිපීනයේදී පෞද්ගලික අංශයෙන් ලබාදෙන අධ්‍යාපනයට ප්‍රවේශවීමට, ලබාගැනීමට හා එම අධ්‍යාපනයේ ගුණාත්මක තත්වය හා මේ හා සම්බන්ධව පවත්නා නීති රෙගුලාසි පිළිබඳව පිලිපීන රජයෙන් විමසා ඇත. මෙම කමිටුව නේපාලයේ සිදුකරන ලද සමාලෝචනයේදීද මේ හා සමාන තත්වයන් නිරීක්ෂණය කර ඇත. එනම් රජයෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන අවම මට්ටමක පැවැතීම සහ සමාජයේ අවසැලකිල්ල සහ වෙනස් කොට සැලකීම ප්‍රවර්ධනය කරමින් පෞද්ගලික අංශයේ පාසල් ගණනාවක් අලුතින් බිහිවීම මෙහිදී පැහැදිලිව දක්නට හැකිවිණි.

පරීක්ෂණයෙන් අනතුරුව පෞද්ගලික පාසල් මගින් ලබාදෙන අධ්‍යාපනයෙන් සමාජ සංශක්තිකභාවයට හානියක් නොසිදුවීමටත්, වෙනස්කොට සැලකිල්ල සහ කොන්කිරීම ප්‍රවර්ධනය නොකිරීමටත් නිසි පියවර ගන්නා මෙන් කමිටුව නේපාල රජයට උපදෙස් දෙන ලදී. විශේෂයෙන්ම අධ්‍යාපනය සඳහා අයකරනු ලබන ගාස්තු, පාඨමාලා සහ ඇතුළත් කරගැනීමේ ක්‍රියාපටිපාටිය නියාමනය කිරීමටත් මේ හා සම්බන්ධ නීති රෙගුලාසි ප්‍රමාණවත් ලෙස ක්‍රියාවට නැංවීමටත් හා පෞද්ගලික පාසල් පරිසරය ළමුන්ට මිත්‍රශීලී පරිසරයක් ලෙස සැකසීමටත් ඔවුන්ට උපදෙස් දෙන ලදී.

පාකිස්තානයේ මානව අයිතිවාසිකම් තත්වයන් පිළිබඳ සමාලෝචනයන්හිද අධ්‍යාපනය සම්බන්ධයෙන් පවත්නා තත්වයන් ගැන අවධානය යොමුවී ඇත. අධ්‍යාපනයේ පවත්වාගෙන යායුතු අවම ප්‍රමිතීන්, පාඨමාලා අවශ්‍යතාවන්, ගුරුවරුන්ගේ ගුණාත්මක තත්වයන් පිළිබඳව නිසි පරිදි අවධානය යොමු නොකරමින් අධ්‍යාපනය පෞද්ගලිකකරණය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ දැඩි අවධානය යොමුවී ඇත. මෙහිදී ඔවුන් නිර්දේශ කර ඇත්තේ පාසල් පෞද්ගලිකකරණය වැළැක්වීමට කටයුතු කරන ලෙසත් පෞද්ගලික පාසල් රජයේ පාසල් වල ප්‍රමිතීන්ට කොතරම් දුරට අනුකූලව කටයුතු කරනවාදැයි අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයන් පිහිටුවන ලෙසය.

මානව හිමිකම් පිළිබඳ දෘෂ්ඨි කෝණයෙන් සලකා බැලීමේදී එකිනෙක හා ගැටෙන මූලධර්ම දෙකක් පිළිබඳව මෙහිදී අවධානය යොමුකළ යුතුවේ. එනම් 1) ළමයකුට නොමිළයේ අනිවාර්ය අධ්‍යාපනය ලැබීමට ඇති අවස්ථාව සහ 2) දෙමාපියන්ට තම ළමයාට අධ්‍යාපනය ලබාදීම සඳහා රජයේ නොවන පාසල් පිහිටුවීමට හෝ ඒවාට ඇතුළත් කිරීමට පවත්නා නිදහසයි.

ලොව පුරාම විශේෂයෙන් දකුණු ආසියාකළාපයේ රටවල් වල මෙම උපනතිය පිළිබඳව විමසිලිමත්වීමට කාලය එළැඹ තිබේ. අධ්‍යාපනය පෞද්ගලික අංශයට පැවැරීමේදී රජයයන් විසින් එසේ සිදුකිරීමට මූලික හේතු වශයෙන් දක්වන්නේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මෙම ක්‍රියාමාර්ගය ගනුලබන බවය. රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශයේ කළමනාකාරිත්වය කාර්යක්ෂම බවත් එමගින් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ගුණාත්මකභාවය සහ ඵලදායීභාවය වර්ධනය කළ හැකිබවට ඔවුන් කරුණු ගෙනහැර දක්වති. මෙයට අමතරව අධ්‍යාපනය සම්බන්ධයෙන් වෙන් කිරීමට ප්‍රමාණවත් තරමු මුදල් නොමැති බැවින් පෞද්ගලික අංශයේ සහයෝගය ලබාගත යුතු බවටද අදහස් දක්වීම් සිදුකර තිබේ.

ශ්‍රී ලංකාවේ තත්වය පිළිබඳව විමසුවිට අධ්‍යාපනයේ සමානත්වය හා ගුණාත්මක තත්වය පවත්වාගෙන යාමට රජය විසින් විවිධාකාරයේ පියවර ගෙන තිබුණද පාසල් අතර පවත්නා විෂමතාව පිළිබඳ ගැටලුව විසඳීමට මෙම පියවරයන් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිය. තම දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා ජනප්‍රිය පාසල් යැයි පිළිගත් නගරයේ ප්‍රසිද්ධ පාසල් වෙත යොමු කිරීමට දෙමාපියන් විධිමත් හා අවිධිමත් ආකාරයෙන් දරන්නාවූ අසීමිත ප්‍රයත්නයන්ගෙන් පෙනීයයි. මෙම ප්‍රවනතාවය හමුවේ නගරයෙන් බැහැර ව පිහිටි පාසල් වල සිසුන් සංඛ්‍යාව අඩුවීමත් අනතුරුව නියමිත සිසුන් ප්‍රමාණයක් නොසිටීම මත මෙම පාසල් වැසීයාමත් සිදුවේ. රජයේ පාසල් වෙත තමදරුවන් ඇතුළත් කිරීමට අපොහොසත් වන දෙමාපියන්ට පවත්නා විකල්පය වන්නේ පෞද්ගලික පාසල්ය. අධ්‍යාපනය ලබාගැනීමට මුදලක් ගෙවීමට ඇති හැකියාව පවත්නා දෙමාපියන්ගේ දරුවන්ට මෙම විකල්ප අවස්ථාව පවතින නමුත් එසේ සිදුකළ නොහැකි දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය අයිතියට මෙමගින් අයහපත් බලපෑම් ඇති කරනු ලබයි. ශ්‍රී ලංකාවේද පෞද්ගලික පාසල් රාශියක් පසුගිය දශකයේදී බිහිවී තිබෙනු පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. උසස් අධ්‍යාපනයය සඳහා හෝ වෘත්තීය ක්ෂේත්‍රයේ අධ්‍යාපනය සඳහා පෞද්ගලික අධ්‍යාපන ආයතන බිහිවීම කාලීන අවශ්‍යතාවයන් ලෙස යමෙකුට පැවැසිය හැකිය. එනමුත් එමගින් ගුණාත්මක තත්වයෙන් යුත් අනිවාර්යය අධ්‍යාපනය නොමිළයේ ලබාගැනීමට ළමයකුට ඇති අයිතියට තර්ජනයක් ඇති කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් දැඩි අවධානයෙන් කටයුතු කළ යුතුවේ. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික අංශයේ පාසල් ක්‍රියාත්මක වන්නේ පෞද්ගලික සමාගම් ලෙස බැවින් මේවා නියාමනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට බලපෑමක් සිදුකළ නොහැක.

# දැනුම්වත්වීමට ඇති අයිතිය සුරකින - තොරතුරු දැනගැනීමේ අයිතිය

අදපවත්නා සංකීර්ණ සමාජක්‍රමය තුළ මිනිසාගේ එදිනෙදා මූලික අවශ්‍යතාවන් ඉටුකරගැනීමට පවා පුද්ගලයින් හෝ ආයතන ගණනාවක සහාය අවශ්‍ය වී තිබේ. මෙම ආයතන සමග ඵලදායීව හා කාර්යක්ෂම අයුරින් ගනුදෙනු කිරීම සඳහා ඒ හා සම්බන්ධ නිවැරදි තොරතුරු නියමිත කාලසීමාවකදී පහසුවෙන් ලබාගැනීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්වී ඇත. තොරතුරු කොතරම් වැදගත්ද යන්න තොරතුරු ලබාගැනීමට හා සන්නිවේදනය කිරීමට වැය කරන්නාවූ මුදල් ප්‍රමාණය ඒ සඳහා ගත කරන්නාවූ කාලය සහ දරණ ප්‍රයත්නය සම්බන්ධයෙන් මොහොතකට අවධානය යොමුකිරීමෙන් අවබෝධ කරගත හැකියි.

තාක්ෂණයේ දියුණුවත් සමගින් එදිනෙදා සන්නිවේදනයේදී තොරතුරු හුවමාරුව ඉතා පහසුවෙන් සිදුකළ හැකිවුවත් අපට අවශ්‍ය වන්නාවූ සමහර වැදගත් තොරතුරු වෙත ප්‍රවේශවීම තවමත් දුෂ්කර කරුණක්ව පවතී. උදාහරණ වශයෙන් රජයේ ආයතන අධිකාරීන් සතුව පවත්නා තොරතුරු ලබාගැනීම සම්බන්ධ ක්‍රියාවලිය දැක්විය හැකිය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි රටවල රාජ්‍ය ආයතන විසින් තමන්ගේ තොරතුරු පොදු මහජනතාවට ලබාගත නොහැකි රාජ්‍ය රහස් ලෙස සැලකීමත් සාම්ප්‍රදායිකව පැවැතගෙන එන නිලධාරීන්ගේ මහේශාක්‍ය ආධිපත්‍යය හැසිරීම් රටාවත් නිසා මෙම තොරතුරු ඉල්ලා සිටින ජනතාව බලවත් අපහසුතාවයකට පත්වේ. කෙසේ වෙතත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක පුරවැසි අයිතීන් පරිපූර්ණව භුක්ති විඳිය හැක්කේ තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශවිය හැකි නම් පමණි.

ලෝකයේ රටවල් 100 කට වැඩි ප්‍රමාණයක් දැනටමත් තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කර තිබේ. ආසියානු කලාපයේ ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය සහ නේපාලය ඇතුලුව රටවල් ගණනාවක් පරිපූර්ණ තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කර තිබේ.

තොරතුරු ලබාගැනීමේ අයිතිය නීතිගත කිරීම නිසා රටවල් බොහෝ ගණනක් ධනාත්මක ප්‍රතිඵල අත්කරගෙන තිබේ. මෙම රටවල් අතරින් ඉන්දියාව විශේෂ තැනක් ගනී. දරිද්‍රතාවයෙන් හා ආන්තිකරණය ලක්වීම යන හේතුන් නිසා අතිශයින් පීඩාවට පත්වූ ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාකළ අරුණා රෝයි මහත්මිය ඉන්දියාවේ තොරතුරු දැනගැනිමේ අයිතිය ලබාගැනීම සඳහා

> තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම සහ එය ක්‍රියාවට නැංවීමට දිනවකවානු සහ යාන්ත්‍රණයන් ක්‍රියාවේ යෙදවීමට කටයුතු කිරීම පැසසිය යුතු කරුණක් වේ. එසේ වුවත් අදාළ අයිතිය සහ ඒ යටතේ ලබා ගත හැකි පහසුකම් පිලිබඳව මහජනතාව පුලුල් අන්දමින් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් අත්‍යාවශ්‍යවේ.

සුවිසල් මෙහෙයයක් ඉටු කළාය. තමන්ට හිමිවිය යුතු වැටුප්, රජයේ ලැබිය යුතු සහනාධාර සහ උපකාර පිළිබඳව තොරතුරු ලබාගැනීමට ග්‍රාමීය අඩු පහසුකම් ලාභී ජනතාව දැනුම්වත් කිරීමත් ඔවුන් පෙළගැස්වීමත් මගින් මෙම අයිතිය ලබාදීමට රජයට බලපෑම් කිරීමට මහජන බලවේග යක් ගොඩ නැගීමට ඇය සමත්වූවාය. තොරතුරු දැනගැනීමේ පනත ඉන්දියානු ප්‍රජාතන්ත්‍රවාදයේ විශාලතම ජයග්‍රහණයක් ලෙස පිළිගැනීමට ලක්වී ඇත. මෙයට අමතරව පොදුවේ මෙම අයිතිය තහවුරු වීම නිසා ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට වඩාත් වැඩි සහභාගිත්වයක් ලබාගැනීමට, කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීමේ ක්‍රියාවලියට, රජයේ තොරතරු කළමනාකරණ ක්‍රියාවලියේ වැඩිදියුණුවට සහ විනිවිදභාවය වර්ධනය වීම මගින් දූෂණය පිටුදැකීමට උපකාරීවීම යන සුභවාදී ප්‍රතිඵල අත්කර ගැනීමට ඉවහල් වී තිබේ.

ඉන්දියාව හා සැසඳීමේදී පොදු ජනතාවගේ දැඩි ඉල්ලීමක් ලෙස ඉදිරිපත් නොවූවත් තොරතුරු දැනගැනීමේ අයිතිය ලබාදෙන ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් ක්‍රියාකාරීන් හා සංවිධාන දශකයකට වැඩි කාලසීමාවක් පුරා විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ රජයට බලපෑම් සිදුකර තිබේ. පසුගිය රජය සමයේදීද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙසට මේ සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත්වූ නමුත් රජය පාර්ශවයෙන් ඵලදායී පියවර ගැනීමත් සිදු නොවිණි

කෙසේවෙතත් මෛත්‍රීපාල සිරිසේන මහතා ඇතුලු නව දේශපාලන බලවේගය තම දින 100 වැඩසටහන යටතේ මහජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ලබාදීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත ගෙන එන බවට පොරොන්දුවක් ලබාදුන්නේය. ඒ අනුව තොරතුරු දැනගනීමේ පනතේ අඩංගු විය යුතු කරුණු පිලිබඳව මහජනතාවගේ අදහස් ලබාගැනීම 2015 පෙබරවාරි මාසයේදී ආරම්භ වූ අතර 2015 දෙසැම්බර් මාසයේදී තොරතුරු දැනගැනීමේ කෙටුම්පත ගැසට් කරන ලදී. මෙම කෙටුම් යෝජනාව 2016 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2016 ජූනි මාසයේදී එය පාර්ලිමේන්තුවේ දී සම්මත විනි. මේ අනුව ශ්‍රී ලංකාව අවසාන වශයෙන් තොරතුරු දැනගැනීමේ අයිතියට නීතිමය තත්වයක් ලබාදුන් දකුණු ආසියානු රටවල් අතරින් එකක් බවට පත්විණි.

මෙම ලිපිය මගින් තොරතුරු දැනගැනීමේ පනතේ පරමාර්ථය, තොරතුරු ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ තොරතුරු දැනගැනීමේ කොමිසමේ කාර්යයභාරය සාරාංශගතව පැහැදිලි කරනු ලබයි.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතෙන් රජය සන්තකයේ පවතින තොරතුරු ලබාගැනීමේ හැකියාව ජනතාවට ලබාදේ. මේ අනුව රජයේ අමාත්‍යාංශ ව්‍යාවස්ථාව මගින් ස්ථාපිත කර ඇති ආයතන, රජයේ දෙපාර්තමේන්තු රජයේ සංස්ථාවන්, රජය විසින් 25%කට වැඩියෙන් කොටස් හිමිකම දරන්නා වූ සමාගම්, පළාත් පාලන ආයතන ඇතුලු රජයේ ආයතන ගණනාවකින් තොරතුරු ලබාගැනීමේ අයිතිය ජනතාවට හිමිවනු ඇත.

මෙහිදී ජනතාවට ලබා ගත හැකි "තොරතුරු" යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි විමසා බලමු. තොරතුරු දැනගැනීමේ පනතේ දක්වෙන ආකාරයට වාර්තා, ලේඛන, කාර්යාලීය නිවේදන, චක්‍රලේඛ ඊ මේල්, ප්‍රවෘත්ති නිවේදන, චක්‍රලේඛයන් ලොග් සටහන්, අණපනත් වාර්තා ඡායාරූප සහ නීති කෙටුම්පත් මේවාට ඇතුළත්වේ.

පවත්නා විධිවිධාන යටතේ ජනමාධ්‍ය ඇමතිතුමා විසින් 2017 පෙබරවාරි මාසයේදී තොරතුරු ලබාගත හැකි ආයතන කාණ්ඩයන් ගැසට් පත්‍රයේ පළ කරනු ඇත. ඉන් පසුව රජයේ ආයතන වලින් තොරතුරු ලබාගැනීමට ජනතාවට

හැකිවනු ඇත.

ජනතාවට මෙම තොරතුරු ලබාගැනීම පහසු කිරීම සඳහා රජයේ ආයතන වලට තොරතුරු නිලධාරීන් පත්කරනු ඇත. මහජනතාවට තමන් කැමැති භාෂාවකින් මෙම තොරතුරු ලබාගැනීම සඳහා ඉල්ලීම් කළ හැකිය. අදාළ පුද්ගලයාට මෙම තොරතුරු ලබාගැනීමේ ඉල්ලුම් පත්‍රය පිරවීමට නොහැකි අවස්ථාවලදී තොරතුරු නිලධාරියා එය සකස්කර දිය යුතු අතර ඔහු හෝ ඇය තොරතුරු ඉල්ලා සිටි බවට තොරතුරු නිලධාරියා විසින් අදාළ තැනැත්තාට ලිඛිතව සහතික කළ යුතුවේ.

මෙම ඉල්ලීම් සිදුකර දින 14 ක් ඇතුළත මෙම තොරතුරු ලබාදිය යුතුද ප්‍රතික්ෂේප කළ යුතු ද යන්න තොරතුරු නිලධාරියා විසින් තීරණය කර, එම ඉල්ලීම පිළිගතහොත් ඉල්ලුම් කර ඇති භාෂාවෙන් දින 14 ඇතුළත එම තොරතුරු ලබාදිය යුතුය. කෙසේ වෙතත් අදාළ තොරතුරු සම්පාදනය සඳහා වාර්තා විශාල සංඛ්‍යාවක් පරීක්ෂා කිරීමට හෝ එම තොරතුරු අදාල රාජ්‍ය ආයතනය සතුව නොපවතින අවස්ථාවන් හිදී මෙම කාළසීමාව උපරිම වශයෙන් දින 21දක්වා දීර්ඝ කළ හැකිය.

තොරතුරු නිලධාරියාට මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් කිහිපයක්ද මෙම පනතේ දක්වා ඇත. ඒවානම්

- පොදු අභිමතාර්තයන් හා කිසිදු සම්බන්ධාවන් නොමැති පෞද්ගලික තොරතුරු,
- රාජ්‍යයේ ආරක්ෂාවට හෝ භෞමික අඛණ්ඩතාවයට තර්ජනයන් වන්නා වූ තොරතුරු
- රජය විසින් අන්තර්ජාතිකව ඇතිකරගත් ගිවිසුම් වලට හානිදායක වන්න වූ තොරතුරු
- අධිකරණයේ ස්වාධීනත්වයට සහ නීතියේ ආධිපත්‍යයට අගතියන් වන්නාවූ තොරතුරු,
- දරුණු අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට බලපෑම් ඇති කරන්නාවූ තොරතුරු
- පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක වරප්‍රසාදයන්ට බලපෑම් ඇති කරන්නාවූ තොරතුරු සහ
- ආර්ථිකයට දැඩි ලෙස බලපෑම් කරන්නාවූ තොරතුරුය

එසේවුවත් තොරතුරු දැනගැනීම සඳහා වූ ඉල්ලීමක් පනතට අනුව ප්‍රතික්ෂේප කිරීමට හැකිවූවත් මෙම තොරතුර ලබාදීමෙන් මහජනතාවට අත්වන ප්‍රතිලාභය එය නිකුත් කිරීමෙන් සිදුවන හානියට වඩා විශාල නම් තොරතුරු නිලධාරීන් අදාළ තොරතුර අනිවාර්යයෙන් නිකුත් කළ යුතුය.

**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මතවීමෙන් පසුව රජයේ ආයතන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 4 වැනි කොටසේ සඳහන් ආකාරයට ඔවුන් සතුව පවත්නා වාර්තාවන්/ තොරතුරු ජනතාවට පහසුවෙන් ලබාගැනීමට හැකිවන ලෙස තොරතුරු /වාර්තා කාණ්ඩගත කිරීම සහ සූචියක් අනුව සකස් කිරීම සිදුකළ යුතුය. මෙහිදී යම් සාධාරණ කාලසීමාවක් ඇතුළතදී රජයේ ආයතන සතුව පවත්නා සියලුම වාර්තා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයට පරිවර්තනය කිරීමට උනන්දු කරනු ලැබේ.**

තොරතුරු නිලධාරියාගේ තීරණය සම්බන්ධයෙන් එකගත්වයට නොපැමිණෙන අවස්ථාවන්හිදී අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබේ. මෙසේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප වූ අවස්ථාවක දින 14 ක් ඇතුළත එම ආයතනය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට එම තැනැත්තාට පිළිවන. අභියාචනය පරීක්ෂා කරන නිලධාරියා මේ සම්බන්ධයෙන් සතිතුනක කාලයක් ඇතුළත තමාගේ තීරණය දැනුම්දිය යුතුය.

මේ සඳහා පත්කර ඇති නිලධාරියාගේ තීරණය සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටි පුද්ගලයා සෑහීමට පත් නොවන අවස්ථාවකදී එම ප්‍රතිචාරය ලැබී මාස දෙකක් ඇතුළත තොරතුරු දැනගැනීමේ කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිවේ. තොරතුරු දැනගැනීමේ කොමිසම මෙම අභියාචනය ලැබීමෙන් අනතුරුව මාස දෙකක් ඇතුළත තොරතුරු නිලධාරියාගේ තීරණය අනුමත කිරීම හෝ එය වෙනස්කිරීම සම්බන්ධයෙන් දැනුම්දීම සිදුකළයුතුය. කොමිසම ලබාදෙන තීරණය සම්බන්ධයෙන් එකග නොවන්නේ නම් මෙම තීරණය ලබාදී මාසයක කාලයක් ඇතුළත ඔහුට හෝ ඇයට මෙම තීරණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම සභාපතිවරයාද ඇතුලුව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතය. මෙහි සාමාජිකයින් ව්‍යවස්ථා සභාවේ නිර්දේශමත ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබේ. පහත දක්වෙන කරුණු සැලකිල්ලට ගනිමින් මෙම පුද්ගලයින් පත් කළ යුතුවේ. කොමිසමේ සාමාජිකයින්

- නීතිය, රාජ්‍ය පාලනය, රාජ්‍ය පරිපාලන, සමාජ සේවා, ජනමාධ්‍යකරණය, විද්‍යා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රයන්හි කැපීපෙනන පුද්ගලයින් විය යුතුය
- පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවන්හි හෝ ප්‍රදේශීය සභාවන්හි සාමාජිකයන් නොවිය යුතුය
- රජයේ හෝ අධිකරණ නිලධාරීන් නොවිය යුතුය
- කිසිදු දේශපාලන පක්ෂයක් හා සම්බන්ධ නොවිය යුතුය සහ
- ව්‍යාපාරික හෝ වෘත්තීයක නියැලෙන්නන් නොවිය යුතුය

එසේම කොමිෂන් සභාවේ පහත දක්වෙන අංශ නියෝජනය කරනු ලබන සාමාජිකයින් ඇතුළත්වේ.

- ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නම්කරන්නාවූ ප්‍රවීන නීතිඥයෙක් හෝ නීති ක්ෂේත්‍රයේ අධ්‍යාපනඥයෙක්
- ප්‍රකාශකයින්ගේ, කතෘවරුන්ගේ සහ ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන වල සාමාජිකයෙක් සහ
- අනෙකුත් සිවිල් සංවිධාන වල නියෝජිතයෙක්

තොරතුරු දැනගැනීමේ කොමිසමේ කාර්යයභාරයන් වලට පහත සඳහන් කටයුතු ඇතුළත්වේ

- තොරතුරු දැනගැනීමේ පනතට අනුව රජයේ ආයතන ක්‍රියාත්මක වනවාද යන්න අධීක්ෂණය කිරීම
- තොරතුරු සඳහා සිදුකරනු ලබන ඉල්ලීම් සඳහා ගාස්තු නියම කිරීම
- රජයේ ආයතන වලට නිවැරදි ආකාරයට වාර්තා කළමනාකරණය කරගැනීම සඳහා මාර්ගෝපදේශ කෙටුම් පත් කිරීම
- පරීක්ෂණ පැවැත්වීම, ආයතන විසින් තබාගෙන සිටින තොරතුරු පරීක්ෂා කිරීම, තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද රාජ්‍ය ආයතන වලට මහජනතාවට තොරතුරු ප්‍රකාශයට පත්කරන ලෙස නියම කිරීම සහ
- තොරතුරු නිලධාරියා විසින් තොරතුරු නොදීමට තීරණය කිරීම නිසා අගතියට/අසතුටට පත් පුද්ගලයින් විසින් යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මතවීමෙන් පසුව රජයේ ආයතන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 4 වැනි කොටසේ සඳහන්

ආකාරයට ඔවුන් සතුව පවත්නා වාර්තාවන්/ තොරතුරු ජනතාවට පහසුවෙන් ලබාගැනීමට හැකිවන ලෙස තොරතුරු /වාර්තා කාණ්ඩගත කිරීම සහ සුචියක් අනුව සකස් කිරීම සිදුකළ යුතුය. මෙහිදී යම් සාධාරණ කාලසීමාවක් ඇතුළතදී රජයේ ආයතන සතුව පවත්නා සියලුම වාර්තා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයට පරිවර්තනය කිරීමට උනන්දු කරනු ලැබේ.

මෙම ක්‍රියාවලිය මගින් තොරතුරු දැනගැනීම සඳහා සිදුකරනු ලබන ඉල්ලීම් වලට පනතේ දක්වා ඇති විධිවිධාන අනුව තොරතුරු නිලධාරීන් ප්‍රතිචාර දක්වීම තහවුරු කරනු ලබයි. මෙයට අමතරව රජයේ ආයතන ඔවුන් සතුව පවතින තොරතුරු, වාර්තා හෝ පුද්ගලයින් විසින් සිදුකරනු ලබන අභියාචනා අස්ථාන ගතකිරීම හෝ විනාශ කිරීම වළක්වනු ලබයි.

තොරතුරු දැනගැනීමේ පනත යටතේ වැරදි ක්‍රියාවන් ලෙස දක්වා ඇති කරුණු වන්නේ

- සිතාමතාම තොරතුරු සැපයීමට බාධා කිරීම හෝ ඕනැකමින්ම අසත්‍ය, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු ලබාදීම
- පුද්ගලයෙක් සන්තකව පවත්නා තොරතුරු විනාශ කිරීම, අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ සැඟවීම
- තොරතුරු දැනගැනීමේ කොමිසම විසින් නියම කරන ලද අවස්ථාවන්හිදී එම කොමිසම ඉදිරියට පැමිණීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට අසමත් වීම
- කොමිසම විසින් ලබාදෙන තීරණයකට අනුගතව කටයුතු කිරීමට අසමත්වීම හෝ කොමිසමේ තීරණ වලට බලපෑම් කිරීම

ඉහත සඳහන් වැරදි ක්‍රියාවන් සිදුකරන පුද්ගලයින් අධිකරණය ඉදිරියට පමුණුවා එහිදී වරදකරුවකු බවට ඔප්පු වුවහොත් පහත සඳහන් දණ්ඩනයන් නියම කළ හැකිය

- රුපියල් 50000 කට නොවැඩි වන්නාවූ දඩමුදලක් නියම කිරීම හෝ
- වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා සිරගත කිරීමකට හෝ
- මෙම දඬුවම් දෙකටම නියම කළහැකියි

මෙයට අමතරව සාධාරණ හේතුවකින් තොරව තොරතුරු නිලධාරියාට සහාය දැක්වීමට අසමත් වන ඕනෑම නිලධාරියෙකු මහේස්ත්‍රාත් අධිකරණ වෙතට පැමිණවිය හැකි අතර එහිදී වරදකරුබවට ඔප්පු වුවහොත් රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් කළ හැකිය.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම සහ එය ක්‍රියාවට නැංවීමට දිනවකවානු සහ යාන්ත්‍රණයන් ක්‍රියාවේ යෙදවීමට කටයුතු කිරීම පැසසිය යුතු කරුණක් වේ. එසේ වුවත් අදාළ අයිතිය සහ ඒ යටතේ ලබා ගත හැකි පහසුකම් පිළිබඳව මහජනතාව පුළුල් අන්දමින් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් අත්‍යාවශ්‍යවේ. බංග්ලාදේශයේ තොරතුරු ලබාගැනීමේ අයිතිය ක්‍රියාත්මකවී දශකයකට වැඩි කාලසීමාවක් ගතවී ඇතත් ජනගහණයෙන් 40% ක් මෙම අයිතිය පිළිබඳව දැනුම්වත්භාවයක් නොමැති බව 2014 වසරේදී එරට සිදුකරන ලද සමීක්ෂණයකින් හෙළිවී ඇත. ශ්‍රී ලංකාවේද ජනතා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත් ඔවුන්ගේ සුභසාධනය සඳහාත් විවිධ නීතිරීති පවතින නමුත් ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක වීමේදී දුර්වලතාවන් රැසක් පවතින බව නිරීක්ෂණය කළ හැකිය. මෙවැනි තත්වයක් අත්වීම වැළැක්වීම සඳහා තොරතුරු ඉල්ලාසිටින මහජනතාව මෙන්ම තොරතුරු ලබාදීමට බැඳී සිටින රාජ්‍ය නිලධාරීන්ද ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් වල පැහැදිලි අවශ්‍යතාවයක් තිබේ.

**ශාන්ත කුලතුංග**

---

**2 වන පිටුවෙන්**

දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට දෑසින් නොදකින ලෝකය දැතින් දකින්නට තෙවන ඇසක් ලෙස උපයෝගී වන්නේ මෙම තිත් හය බව කිව යුතු ය. පංති කාමරය තුළ දෑස පෙනෙන ළමුන් අතර හිඳ ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, භූගෝලය, ඉතිහාසය ආදී සෑම විෂයක් ම අධ්‍යනය කිරීමට ලැබෙන්නේ තිත් හය නිසා ය. අ.පො.ස. සා/පෙළ, අ.පො.ස. උසස් පෙළ ආදී තරඟකාරී විභාගයන්ට පෙනී සිට ජය ලබා සරසවි වරම් ලබා ගන්නේත් තිත් හය නිසා ය. උපාධි ලත් ගුරුවරු, නීතීඥවරු වෙනත් වෘත්තීන් සඳහා දෘෂ්‍යාබාධිත පුද්ගලයින්ට පිවිසීමට පාර කියා දෙන්නේ තිත් හය යි.

අපූරු බලයක් ගැබ් වී තිබෙන මෙම තිත් හයෙන් අක්ෂර ලිවීමට විවිධ උපකරණ භාවිතා කිරීමට සිදු වේ. මේ අතර ඉතා වටිනා ම උපකරණය වන්නේ බ්‍රේල් යතුරු ලියනය යි. මෙය තරමක් විශාල උපකරණයක් වන අතර එහා මෙහා ගෙන යාම තරමක් දුෂ්කර ය. අධික මිලකින් යුත් බ්‍රේල් යතුරු ලියනය ලබා ගැනීම ඉතා අසීරු වන අතර මෙය ක්‍රියාත්මක කිරීමේ දී ඉතා උස් හඬක් මතු වේ. සාමාන්‍ය රටාවට ම වමේ සිට දකුණට මෙහි අකුරු ලිවිය හැකි ය.

තවත් බ්‍රේල් ලියන උපකරණයක් ලෙස ''ස්ලේට් එක'' දැක්විය හැකි ය. මෙය ඉතා කුඩා උපකරණයක් වන අතර ගෙන යාම

> තිත් හය කියා දෙන රහසින් ජීවිතය ජය ගන්න වෙර දරන දරුවන් පංති කාමරය තුළ විවිධ ගැටලුවලට මුහුණ පාන බව සඳහන් කළ යුතු ය.

ඉතා පහසු ය. පයිල් කවරයක් වැනි මෙම උපකරණය තුළට කඩදාසියක් ඇතුළු කර පංහිඳ (ස්ට්‍රයිලස්) වැනි කටුවකින් සිදුරු කළ යුතු ය. මෙහි දී දකුණේ සිට වමට අක්ෂර ලියන අතර කියවීමේ දී වමේ සිට දකුණට කියවිය හැකි ය.

බ්‍රේල් හෝඩිය හුරු කිරීමට බේලට් එක (බ්‍රේල් පෝරුව) යන උපකරණය භාවිතා කරන අතර ගණන් සෑදීම සඳහා ද වෙනම උපකරණ භාවිතා කරනු ලබයි.

තිත් හය කියා දෙන රහසින් ජීවිතය ජය ගන්න වෙර දරන දරුවන් පංති කාමරය තුළ විවිධ ගැටලුවලට මුහුණ පාන බව සඳහන් කළ යුතු ය.

01.අවශ්‍ය පෙළ පොත් (බ්‍රේල් මාධ්‍යයෙන්) නිසි කලට වේලාවට නොලැබීම.

02.බ්‍රේල් උපකරණ ක්‍රියාත්මක කිරීමට හෝ බ්‍රේල් මාධ්‍ය පිළිබඳව පුහුණුවක් ලත් ගුරුවරු පාසල තුළ නොසිටීම.

03.පංති කාමරය හා අවට වට පිටාව තමන්ට පහසු ආකාරයෙන් සකස් වී නොතිබීම.

ආදී ගැටලු කිහිපයක් පමණක් මෙහි දී සඳහන් කරමි. මේ සියලු අභියෝග ජයගෙන ජීවිතය ජය ගන්න දෘෂ්‍යාබාධ සහිත ළමුන්ට තිත් හය දීප්තිමත් ආලෝකයක් වන බව කිව යුතු ය.

**හර්ෂනී දයානන්ද**
**(ශාස්ත්‍රවේදී ගෞරව)**
**සහන ආබාධිතයන් සඳහා වූ සංගමය- අනුරාධපුර**

# ආබාධ සහිත ප්‍රජාව සහ තාක්ෂණය



"තාක්ෂණයේ බලයට ආබාධිතභාවය පරදියි." බොහෝ දෙනෙකුට මේ ප්‍රකාශය අවිශ්වාසයට හෝ සිනහවට කරුණක් විය හැකි ය. එහෙත් සත්‍යය නම්, නිසි පුහුණුවකින් පසු, බරපතල තත්ත්වයේ ආබාධිතභාවයෙන් පෙළෙන අයෙකුට වුවද, තාක්ෂණය මගින් කළ හැකි සෑම ක්‍රියාකාරකමක් ම පාහේ ඉතාම සාර්ථකව සිදු කළ හැකි වීම යි.

ආබාධිත පුද්ගලයෙකුගේ ජීවිතය ඵලදායී කිරීමට තාක්ෂණයට විශාල කාර්යයක් කළ හැකි ය. දියුණු ආර්ථික හා සමාජ තත්ත්වයන් සහිත රටවල ආබාධිතයින් භුක්ති විඳින සාපේක්ෂ සමෘද්ධිමත් ජීවිත පිටුපස ඇත්තේ තාක්ෂණයේ මහිමය යි. මෙම තාක්ෂණය "අනුවර්තිත තාක්ෂණය" ( Assistive Adaptive technology) ලෙස හැඳින්වේ.

පුද්ගලයෙකු දීර්ඝකාලීන ආබාධයකට ලක්වීම නිසා මුහුණපෑමට සිදු වන ගැටළු අතිමහත් ය. එහෙත් මෙහි දී විමසා බැලිය යුත්තේ එකී ආබාධිතභාවය කරණ කොට ගෙන මුහුණපෑමට සිදු වන ගැටළු සකස් වන්නේ කෙසේ ද යන්න යි. මේ ලෝකයේ සිටින සියල්ලන් ම ආබාධ සහිත පුද්ගලයින් වුවා යැයි සිතමු. එවිට එම තත්ත්වයන්ට අනුකූලව කුදුමහත් මානව ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය සකස් වනු ඇත. එවන් ලෝකයක ගැටළුවලට මුහුණ දෙන්නේ ශාරීරික හෝ මානසික ආබාධයක් නොමැති පුද්ගලයන් ය. ලෝකය ඔවුන් උදෙසා සකස් වී නොමැති හෙයිනි. එලෙස කරුණු සලකා බලන කල, කිසියම් තැනැත්තෙකු ආබාධිතභාවයට පත් වීමත් සමග මුහුණ දීමට සිදු වන ගැටළුවලින් අතිවිශාල ප්‍රමාණයක් සකස් වන්නේ පවත්නා මානව ශිෂ්ඨාචාරය, සංස්කෘතිය, සමාජය එම පුද්ගල ගැටළු ආවරණය කිරීමට සූදානම් නොමැති හෙයින් බව වටහා ගත හැකි වනු ඇත.

විවිධ සමාජ, ආර්ථික, සෞඛ්‍යමය හා සංස්කෘතික විෂමතා කරණ කොට ගෙන ආබාධිතයින් ලෝකයට පහළ වේ. එය මානව ඉතිහාසයේ ආරම්භයේ සිට අනාගතයේ අවසානය තෙක් ප්‍රවාහයක් ලෙස අඛණ්ඩව සිදු වනු ඇත. කරුණු එසේ නම්, උසස් මනසක් සහිත මිනිසුන් ලෙස ආබාධිතභාවයට ගොදුරු වූ තැනැත්තන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීමට කුමක් කළ යුතු ද?

නියත වශයෙන් ම සියලු භෞතික හා අභෞතික සංස්කෘතීන් හා සමාජ තත්ත්වයන් සැලසුම් කිරීමේ දී, ගොඩනැගීමේ දී ඔවුන්ගේ සුවිශේෂී ජීවන ගැටළු ද සැලකිල්ලට ගෙන එය සිදු කළ යුතු ය. මේ ලිපියේ අන් තැනක ද සඳහන් කළ, අනුවර්තිත තාක්ෂණය යනු එවන් ප්‍රයත්නයක ඉෂ්ඨ ප්‍රතිඵලය යි. එමගින් අදාළ වින්දිත ජන කොටස්වලට තම ජීවිත පහසුවෙන් ගත කිරීමට විකල්ප ක්‍රමවේද සපය යි.

දෘෂ්‍යාබාධිතයින්, ශ්‍රව්‍යාබාධිතයින්, කථනාබාධිතයින්, අත්පා ආදී ශරීරාංග යක දීර්ඝකාලීන අක්‍රියතාවන් නිසා ආබාධයන්ට ලක්වී සිටින්නන්, මානසික ආබාධිතතාවන්ගෙන් පෙළෙන්නන් සහ එකම පුද්ගලයා මත මෙකී ආබාධිතතා දෙකක් හෝ වැඩි ගණනක් දැකිය හැකි පුද්ගලයන් සඳහා වුව ද, දැනට ලෝකයේ අනුවර්තිත තාක්ෂණික මෙවලම් හා ක්‍රමවේද ගොඩනැගී ඇත. ඒවායේ නිසි හා ඵලදායී ක්‍රියාකාරීත්වය මත බොහෝ දෙනෙක් ස්වාධීන ජීවිත ගත කරති. එහෙත්, අප රටේ වෙසෙන ආබාධිතයින්ගෙන් අතිමහත් බහුතරයකට මෙම වරම ලැබෙන්නේ නැත. ඊට බලපාන එක් හේතුවක් වන්නේ අනුවර්තිත තාක්ෂණික මෙවලම් මිලෙන් අධික වීම හා දේශීය වශයෙන් ලබා ගත නොහැකි වීම යි.

ඇත්ත වශයෙන් ම, ලෝකයේ වඩා සමෘද්ධිමත් රටවල පවා ආබාධිතයින්ට මෙකී උපකරණ ලැබෙන්නේ රාජ්‍යයේ මැදිහත්වීමෙන් විවිධ යෝජනා ක්‍රම මගිනි. එබැවින්, අප රටේ ආබාධිත ජන කොටස්වලට අවශ්‍ය උපකාරක මෙවලම් ලබා දීමේ දී ද රාජ්‍ය අංශයට විශාල කාර්යයක් පැවරී තිබේ.

එහෙත්, අප රටේ ආබාධිතතාව විග්‍රහ කෙරෙන්නේ, සැලසුම් සකස් කෙරෙන්නේ එතරම් පුළුල් අවකාශයක සිට නොවේ. ආබාධිතතාව යනු අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, නිවාස, ළමා කටයුතු, කාන්තා කටයුතු, යෞවන කටයුතු, රැකීරක්ෂා, විද්‍යා හා තාක්ෂණ, මහජන උපයෝගිතා ආදී අමාත්‍යාංශ රාශියක් ඒකාබද්ධව ආවරණය කළ යුතු ක්‍රියාවලියකි. එහෙත්, අප රටේ ආබාධිතභාවයට අදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීම සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ විෂය පථයට ලඝු කර ඇත. අවාසනාව නම්, ආබාධිත ක්ෂේත්‍රයේ ම, දේශපාලන ගැති, ඇතැම් නායක කාරකාදීන් ද තත් විෂය පිළිබඳ ස්වකීය අවබෝධයේ පටු සීමාවට සමස්ත ලාංකේය ආබාධ සහිත ප්‍රජාව, ඔවුන්ගේ අනුමැතියකින් තොරව ම ගාල් කිරීම යි.

කෙසේ වෙතත්, අපට ක්‍රියාත්මක වීමට ඇති පටු සීමාව තුළ සිට වුවද, ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග රාශියක් ඇත. ඒ අතරින්

- ආබාධිත පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කොට අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීම
- අනුවර්තිත තාක්ෂණය හඳුන්වා දීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම
- ආබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය විශේෂ තාක්ෂණය හඳුන්වා දීම
- සෞඛ්‍ය, ප්‍රවාහන, රැකීරක්ෂා සහ සමාජ ස්වාධීනත්වය ආදී ක්ෂේත්‍රයන්ට අදාළව තාක්ෂණය සැලසුම් කිරීම හෝ එබඳු තාක්ෂණ සැලසුම් කිරීමෙහි යෙදී සිටින රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම

ඉහත ක්‍රියාමාර්ග සියල්ල ම හෝ එකක් හෝ ක්‍රියාවට නැංවීමට හැකි වුවහොත්, එමගින් ආබාධ සහිත පුද්ගලයින්ගේ ජීවිත ආලෝකමත් කිරීමට අවශ්‍ය මග හෙළිපෙහෙළි වෙනවා නියත ය. එවන් කටයුත්තක දී පෙරමුණ ගැනීමට අපිදු අපේක්ෂා සහගතව සිටිමු.

**අශෝක බන්දුල වීරවර්ධන.**
**අගෝස්තු 09, 2016.**

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය ලෝක ළමා දිනය සහ ගුරුවරුන්ගේ දිනය මහත් ඉහළින් සමරනු ලබයි

අධ්‍යාපනය සම්බන්ධයෙන් අන්තර්ජාතිකව පිළිගත් වැදගත් දිනයන් වන ලෝක ළමාදිනය සහ ගුරුවරුන්ගේ දිනය සැමරීමේ

වැඩසටහන් පැවැත්වීමට අධ්‍යාපන සංවර්ධන සන්ධානය කටයුතු කරණ ලදී. මේ අනුව ලෝක ළමා දිනය වෙනුවෙන් ඔක්තෝබර් මාසයේදී ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ගුවන් විදුලි සේවාවන් ඔස්සේ ළමා දින වැඩසටහන් පවත්වන ලදී. ඌව පළාත, දකුණු පළාත, මධ්‍යම පළාත සහ උතුරු මැද පළාතේ පිහිටා ඇති ප්‍රදේශීය සහ ප්‍රජා ගුවන්විදුලි සේවාවන් වන ඌව

ප්‍රජා ගුවන් විදුලිය, රුහුණු සේවය, රංගිරි දඹුලු සේවය සහ රජරට සේවය සමගින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය. මෙම

වැඩසටහන් මෙහෙයවීම අදාළ පළාත් වල සාමාජික සංවිධාන වල සහාය ඇතිව පළාත් සම්බන්ධිකාරකවරුන් විසින් සිදුකරන ලදී. මෙයට අමතරව ළමුන්ගේ ක්‍රියාකාරකම් ඇගයීමේ වැඩසටහන් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්ද මෙදින සිදුකරනලද

ක්‍රියාකාරකම් වලට ඇතුළත්ය.

## ගුරුදිනය වෙනුවෙන් පැවැති වැඩසටහන් වල අවස්ථා කිහිපයක්










ඔක්තෝබර් මාසයට යෙදෙන ලෝක ගුරු දිනය සැමරීමට සමගාමීව ගුරුවරුන් විසින් සිදු කරන ලද සේවය ඇගයීම සඳහා ගුරුවරුන් ඇගයීමේ ප්‍රණාම පිරිනැමීමේ උත්සව ගණනාවක් අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ මූලිකත්වයෙන් පවත්වන ලදී. මෙම වැඩසටහන් උතුරු පළාතේ හැරුණු විට අනෙකුත් සියලුම පළාත් වල සංවිධානය කරන ලද අතර මේ සඳහා සාමාජික සංවිධාන වල සහ පළාත් සම්බන්ධිකාරකයින් මූලිකත්වය ගෙන කටයුතු කළහ.

මෙම වැඩසටහන් අදාළ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන බලධාරීන්ගේද අනුමැතිය හා සම්බන්ධීකරණ ඇතිව පවත්වන ලදී. මෙමගින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් සෘජුවම අධ්‍යාපන බලධාරීන් හා ගුරුවරුන් තුළ පෙළඹවීමක් කැපවීමක් ඇතිකිරීමට හැකිවූ බවට සංවිධායකයින් පවසා සිටියහ. මෙම වැඩසටහන් වලදීද තිරසාර සංවර්ධන අරමුණු සහ විශේෂයෙන් තිරසාර සංවර්ධන අරමුණු අංක 4 සියලුදෙනා අන්තර්ගතවූ සමානාත්වතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයත් සියලු දෙනාට ලබාගැනීමෙ අවස්ථාව තහවුරු කිරීම යන කරුණු සම්බන්ධයෙන් දැනුම්වත්කිරීම් සිදුකරන ලදී. මෙමගින් අධ්‍යයාපන ක්ෂේත්‍රයේ බොහෝ පිරිසකට නව දැනුමක් එක්කරලීමට අවස්ථාව සැලසුනු අතර මෙවැනි දැනුම්වත් කිරීමේ වැඩසටහන් තවදුරටත් සංවිධානය කරන මෙන්ද ඒ සඳහා තමන්ගේ දායකත්වය ලබාදීමට සූදානම් බව ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන බලධාරීන් විසින් සඳහන් කළ බවට වාර්තා වී තිබේ. එසේම අධ්‍යපන සංවර්ධන සන්ධානයට අධ්‍යාපන පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිගැනීමත් ඇතිකිරීමටත් සම්බන්ධතා සවිමත් කරගැනිමටත් හා ඉදිරි වැඩසටහන් වලදී අදාළ බලධාරීන් හා සම්බන්ධවී කටයුතු කිරීමටත් මෙමගින් අනගි අවස්ථාවක් උදාවිය.

## ළමා දිනය වෙනුවෙන් පැවැති වැඩසටහන් කිහිපයක ඡායාරූප පහතින් දැක්වේ














# 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ සත්‍යය සහ යථාර්තය

පුත්තලම දිස්ත්‍රික්කයේ 2015 ප්‍රතිඵල ආශයෙනි.

ගතවූ සෑම වසරකම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය,අධ්‍යාපන හා දේශපාලන ක්ෂේත්‍ර වල පමණක් නොව පුලුල් සමාජය තුලද සාකච්ඡාවට බඳුන්වූ වඩාත් විවාද සම්පන්න මාතෘකාවකි.

විටක 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය දෙමාපියන්ගේ විශේෂයෙන් මව්වරුන්ගේ විභාගය ලෙස සමහර පාර්ශවයන් හැඳින්වීමට පුරුදුව ඇත්තේ වර්තමානය වන විට අධ්‍යාපනය පිළිබඳව වැඩි උනන්දුවක් සහ අවධානයක් යොමුව ඇත්තේ ස්ත්‍රී පාර්ශවය තුළවීම නිසාම විය හැකිය. එය වෙනම සාකච්ජා කළයුතු මාතෘකාවකි.

මෙම ලිපිය තුලින් බෙදාහදා ගැනීමට උත්සාහ කරනු ලබන්නේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම හොඳද, නරකද හෝ එය පවත්වනු ලබන ආකාරය හරිද වැරදිද යන කරුණු සාකච්ජා කිරීමට නොවේ.

මෙහි අරමුණ වන්නේ විශේෂයෙන් 2015 වසරේදී පුත්තලම දිස්ත්‍රික්කය ( පුත්තලම හා හලාවත අධ්‍යාපන කලාප ) තුලින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් සම්බන්ධව හැඟීම් සහ ආවේග යන සංවේදී සාධක වලට අයත් නැති එහෙත් පුලුල් සමාජයේදී වඩාත් ගැඹුරින් සාකච්ජා නොවන දත්ත හා තොරතුරු පදනම් කර ගනිමින් විග්‍රහයක් ඉදිරිපත් කිරීමටය.

1 වගුව

ස්ත්‍රී / පුරුෂ භාවය අනුව 2015 වර්ෂයේදී 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පෙනීසිටීම හා කඩයිම් ලකුණු මට්ටම අභිබවා යාම.

| විස්තරය | පුරුෂ | | | ස්ත්‍රී | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනීසිටීම | සමත්වීම | ප්‍රතිශතය | පෙනීසිටීම | සමත්වීම | ප්‍රතිශතය | පෙනීසිටීම | සමත්වීම | ප්‍රතිශතය |
| ශ්‍රී ලංකාව | 167717 | 14383 | 8.6 | 165995 | 17470 | 10.53 | 333672 | 31853 | 9.6 |
| පුත්තලම | 6176 | 506 | 8.2 | 6327 | 586 | 9.35 | 12503 | 1092 | 8.7 |

**ශ්‍රී ලංකාව හා පුත්තලම දිස්ත්‍රික්කය සැසදීම.**

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ට අයත් අධ්‍යාපන කලාප 98 ම නියෝජනය කරමින් 2015 වසරේදී 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා අයදුම්කරුවන් 333672 ක් පෙනී සිට ඇත. එයින් ඒ ඒ දිස්ත්‍රික්ක වලට අයත් කඩයිම් ලකුණු සීමාව ඉක්මවා විභාගය සමත්වී ඇත්තේ අයදුම්කරුවන් 31853 පමණි. එය ප්‍රතිශතයක් ලෙස 9.6% කි. එය තවත් ආකාරයකට විග්‍රහ කළහොත් ඒ ඒ දිස්ත්‍රික්කවල කඩඉම් ලකුණු මට්ටම අභිබවා විභාගය සමත්ව ඇත්තේ අයදුම්කරුවන් 10 දෙනෙකුගෙන් එක් අයකු පමණි.

2 වගුව

ස්ත්‍රී / පුරුෂ භාවය අනුව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පෙනීසිටීම (ප්‍රතිශතයක් ලෙස) පුත්තලම දිස්ත්‍රික්කය

| ස්ත්‍රී / පුරුෂ භාවය | පෙනීසිටීම | ප්‍රතිශතය |
|---|---|---|
| පුරුෂ | 6176 | 49.4 |
| ස්ත්‍රී | 6327 | 50.6 |
| එකතුව | 12503 | 100.0 |

3 වගුව

ස්ත්‍රී / පුරුෂ භාවය අනුව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්වීම පුත්තලම දිස්ත්‍රික්කය.

| ස්ත්‍රී / පුරුෂ භාවය | පෙනීසිටීම | සමත්වීම | පෙනීසිටීම |
|---|---|---|---|
| පුරුෂ | 6176 | 506 | 8.2 |
| ස්ත්‍රී | 6327 | 586 | 9.3 |
| එකතුව | 12503 | 1092 | 8.7 |

පුත්තලම දිස්ත්‍රික්ක තුලින් පෙනීසිටින ලද අයදුම්කරුවන් සංඛ්‍යාව 12503 කි. එයින් දිස්ත්‍රික් කඩඉම් ලකුණු මට්ටම සපුරා විභාගය සමත්වී ඇත්තේ 1092 ක් හෙවත් 8.7 කි. ඒ අනුව මෙම දිස්ත්‍රික්කයේ කඩයිම් ලකුණු මට්ටම අභිබවා විභාගය සමත්ව ඇත්තේ අයදුම්කරුවන් 12 දෙනෙකුගෙන් එක් (1) අයකු පමණක් වේ.

පිරිමි අයදුම්කරුවන් ගෙන් 8.2 % ක්ද ගැහැනු අයදුම්කරුවන්ගෙන් 9.3 % ක්ද පුත්තලම දිස්ත්‍රික්කයේ කඩඉම් ලකුණු මට්ටම අභිබවා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්ව ඇත.

4 වගුව

භාෂා මාධ්‍ය අනුව

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්වීම

පුත්තලම දිස්ත්‍රික්කය

| භාෂා මාධ්‍යය | පෙනීසිටීම | සමත්වීම | ප්‍රතිශතය |
|---|---|---|---|
| සිංහල | 9359 | 950 | 10.2 |
| දෙමළ | 3144 | 142 | 4.5 |
| එකතුව | 12503 | 1096 | 8.7 |

**5 වගුව**
ආදායම් තත්වය අනුව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්වීම පුත්තලම දිස්ත්‍රික්කය.

| ආදායම් තත්වය | පෙනීසිටීම | සමත්වීම | ප්‍රතිශතය |
|---|---|---|---|
| ඉහළ | 2643 | 533 | 20.2 |
| පහළ | 9860 | 559 | 5.7 |
| එකතුව | 12503 | 1092 | 8.7 |

5 වගුව අනුව පැහැදිලි වන වැදගත් කරුණක් වන්නේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉහළ ආදායම් ලබන කාණ්ඩයට අයත් අයදුම්කරුවන් 5:1 අනුපාතයට 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත්වන විට, පහළ ආදායම් ලබන කාණ්ඩයට අයත් අයදුම්කරුවන් 20:1 අනුපාතයට ශිෂ්‍යත්ව විභාගය සමත්ව ඇති බව නොවේ ද?

තවදුරටත් මෙම දත්ත පිළිබඳව ගැඹුරින් විග්‍රහ කර බැලීමේදී දක්නට ඇත්තේ පහළ ආදායම් කාණ්ඩයට අයත්ව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත්වන පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් දරුවන් 20 දෙනෙකුගේ එක් අයකුට ශිෂ්‍යත්ව ආධාර මුදලක් හෝ ලබා සිටි ලකුණු මට්ටම අනුව විභාග ක්‍රමය විසින් තෝරා දෙන ලද පාසලක 6 ශ්‍රේණියේ සිට අධ්‍යාපනය ලබාදීමට දරනු ලබන උත්සාහය සඳහා දෙමාපියන් හා රජය මගින් කොපමන මුදලක්, කාලයක් හා ශ්‍රමයක් යොදන්නේ ද යන්නයි.

මීට අමතරව ඉහළ ආදායම් ලබන කාණ්ඩයට අයත්ව ශිෂ්‍යත්ව විභාගයට පෙනීසිටින අයදුම්කරුවන් සඳහා 5:1 අනුපාතයට විභාග ක්‍රමය මගින් තෝරා දෙනු ලබන පාසලක 6 ශ්‍රේණියේ සිට අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමිව තිබූ බව මෙම දත්ත හා තොරතුරු මගින් අනාවරණය වේ. මෙමගින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ සත්‍ය සහ යථාර්තය යම් ප්‍රමාණයකට හෝ අවබෝධ කර ගැනීමට හැකිවනු ඇතැයි විශ්වාස කරමි.

**- කේ.ඩී. පීරිස්**

# හොඳම දේ දරුවන්ට නම් නිසි ප්‍රථමාධාර පුහුණුවක් පෙර පාසල් ගුරුවරුන්ට අවශ්‍ය නොවේද ?

**මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකින් ඇසුණු කථාවකි**

වේලාව උදාසන 10.30 ට පමණ ඇත. මේ පෙර පාසල් සිඟිත්තන් දිවා ආහාරය ලබා ගන්නා අවස්ථාවයි. සිඟිත්තන් අතරෙ සිටි එක් සිඟිත්තකු දිවා ආහාරය ගනිමින් සිටින අවස්ථාවේදී නිදි කිරා වැටෙන අයුරු ගුරුතුමියගේ තීක්ෂණ දෙනෙතට යොමුවේ. වහා දරුවා අසලට දිවගිය ගුරු තුමිය දරුවා අවදි කරන්නට උත්සාහ කළාය. උත්සාහය ප්‍රතිඵල රහිතය. කුමක් කරන්නදැයි කියා එක් වරම ඇයට නොසිතුන මුත් හැකි ඉක්මනින් රෝහල් ගත කිරීමට සුදුසු යැයි සිතා ඇය වහාම දරුවා කැටුව රෝහල වෙත පියමැන වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරුවා යොමුකරන ලදී. එහිදී වෛද්‍යවරයා පැවැසුයේ දරුවාගේ රුධිරයේ සීනි මට්ටම පහත බැස තිබීම මෙම තත්වයට හේතුවූ බවයි. දරුවා දිනක් රෝහලේ ප්‍රතිකාර ලබා නිවසට පැමිණියද සායන සඳහා දරුවා යොමු කර තිබිණි. මෙපමණක් නොව තවත් විවිධ හදිසි අනතුරු පාසල තුළ, ජලය අශ්‍රිතව, සතුන්ගෙන් හා ක්‍රීඩා පිටියේදී ඕනෑතරම් සිදුවිය හැකිය. එසේනම් ගුරුවරුන් මෙවැනි තත්වයන්ට මුහුණු දීමටත් දරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ යහපත් සෞඛ්‍ය මට්ටම රැකගැනීමට විධිමත් න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබා සිටීම අත්‍යාවශ්‍ය සාධකයක් බව ඔබට නොහැගෙන්නේද? අද පෙර පාසල් පාඨමාලා ඕනෑතරම් තිබේ. නමුත් ඒවා එකකින් වත් විධිමත් ප්‍රථමාධාර පුහුණුවක් ගුරුතුමියකට ලැබෙන්නේ නැත. තවද පෙර පාසල් ගුරුතුමියක් වීමට ප්‍රථමාධාර පුහුණුවක් අවශ්‍ය යැයි අපේ රටේ සැලකෙන්නේද නැත. මෙම තත්වය දරුවන් ගේ ජීවිත පිළිබඳ මහත් අවදානමක් ඇතැයි මට හැඟේ. ඒ මන්ද යත් දරුවක හදිසි අනතුරකට රෝගයකට ලක්වූ අවස්ථාවක ගුරුතුමිය විසින් නිවැරදි ප්‍රථමාධාරය ලබානොදීම දරුවාගේ ජීවිතය අහිමිවීමට හෝ මුලු ජීවිත කාලයටම බලපාන කරුණක් වීමට හේතු විය හැකි බැවිණි.

**සකස් කලේ ආර් පී එන් රාජපක්ෂ**

# ගුරු ආචාරධර්ම රටට නිධානයක්

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අංක 2012/37 සහ 2012/10/05 දිනැති ගුරුවරුන්ගේ සදාචාරත්මක හැසිරීම පිළිබඳව ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව මැයෙන් චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබ ඇත. එහි අඩංගු වන කරුණු වල සාරාංශයක් මෙම ලිපියේ ඉදිරිපත් කර ඇත.

**භූමිකා 06**

වේදයුගයේ ලියැවුණු ශාස්ත්‍ර පොත් අතරින් “කුලණිව තන්ත්‍රයේ ගුරුවරුයෙකුට අයත් භූමිකා හයක් සඳහන්වේ. එනම් (1) ප්‍රේරක හෙවත් ඉගෙනීමට උනන්දු කරවන්නා (2) සුචක හෙවත් විද්‍යාත්මක විනය පෙන්වාදී එය හුරුකරවන්නා (3) වාචක හෙවත් පිළිවෙත් හා ක්‍රියාපටිපාටි පැහැදිලිකර දෙන්නා (4) දර්ශක හෙවත් කාර්ය කොටස් පෙන්නුම් කරදෙන්නා (5) ශික්ෂක හෙවත් අධ්‍යයන විෂය පිළබඳව උපදෙස් දෙන්නා සහ (6) බෝධක හෙවත් ඥාණය නැමැති පහන සිසුන්ගේ සිත්හි දල්වා අවබෝධය ස්ථාපිත කරන්නා යන භූමිකායි.

**භූමිකා අට**

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ඉහත කී ආචාරධර්ම පද්ධතියේ ගුරුවරුන්ට පැවරෙන කාර්යයන් අට වැදූරුම් වේ.

**ආදර්ශවත් පුද්ගලයා**

ප්‍රධාන වශයෙන් ගුරුවරයා ආදර්ශමත් පුද්ගලයකු විය යුතුය. යහපත් චර්යාවන්

අනුව ශික්ෂණය වී සමාජ අපේක්ෂාවන් සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා කැපවීම ගුරුවරයකුගේ පරම යුතුකමයි. ඒ සඳහා යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය රැකගැනීම, සංස්කෘතියට අනුකූල අන්දමින් මෙන්ම විනිත සහ සංවර බව රැකෙන පරිදි පිරිසිදු ඇඳුමෙන් සැරසීම, අහිතකර පුරුදු හා අපචාර වලින් වැළකී සිටීම, අපකීර්තියට පත් පුද්ගලයින් ආශ්‍රය නොකිරීම, පුරසාරම් නොදෙඩවීම, අනෙක් ගුරුවරුන් හා සිසුන් බිය නොගැන්වීම, තම පෞද්ගලික මතවාද පිළිගැනීමට සිසුන් පෙළඹවීමෙන් වැළකීම, අන් ගුරුවරුන් හෙළා නොදැකීම, සමබර පුද්ගලයකු ලෙස මනාව හැසිරීම, සහෝදර ගුරුභවතුන් වෙනුවෙන් සහ සිසුන්ට අසාධාරණයක් නොකිරීම, කොන් කිරීමෙන් බිය ගැන්වීමෙන් වැළකීම හා එවැනි දේ කරන්නන්ගෙන් සිසුන් ආරක්ෂා කිරීම, සිසුන් සමග සාකච්ඡා කරන අවස්ථාවලදී ජංගම දුරකතන භාවිතා කිරීමෙන් වැළකී සිටීම, සෑම විටම සමාජ සම්මතයන්ට ගරු කිරීම මිනිසුන් හා සතුන් පිළිබඳව සංවේදීතාව පෙන්වා ක්‍රියා කිරීම මීට ඇතුළත්වේ.

**ස්ථානීය මවුපියෝ**

දිනකට පැය 06 ක පමණ කාලයක් දරුවන් ගුරු මහත්ම මහත්මීන් සමග ගතකරන හෙයින් ගුරුවරුන් ස්ථානීය දෙමව්පියන් ලෙස කටයුතු කළයුතුව ඇත. මේ සඳහා දෙමාපියන්, ගුරුවරුන් කෙරෙහි තබා ඇති විශ්වාසය තහවුරු වන අන්දමින් කටයුතුකිරීම, භේද නොසලකා සෑම සිසුවකටම සාධාරණව හා අපක්ෂපාතීව ආදරය, කරුණාව, සැලකිල්ල හා ආරක්ෂාව සැලසීම, දරුවන්ට ඔවුන්ගේ නමින් හෝ දුව පුතා යනුවෙන් ඇමතීම, සිසු සිසුවියන්ගේ විශේෂ අවශ්‍යතා ගැටලු සම්බන්ධයෙන් විමසිලිමත්ව සිටීම සහ අවශ්‍ය අවස්ථාවලදී විශේෂඥ උපදෙස් ලබාදීමට කටයුතු කළ යුතුයි.

**දැනුම කුශලතා සහ ආකල්ප සංවර්ධකයෝ**

සිසුන් තුළ දැනුම, දක්ෂතා, ජීවන කුශලතා සහ ප්‍රගතිශීලී ආකල්ප වර්ධනය කිරීම සෑම ගුරුවරයකුගේම මූලික වගකීම බව සියලු දෙනම දනිති. විෂයයන් ඉගැන්වීමේදී සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කරමින් හොඳින් සූදානම් වී තම පන්ති වල සිසුන්ට විචාරාත්මක චින්තනය වර්ධනය කිරීමට උත්සාහ කළ යුතුය. පාඩම් වලට අදාළ අතිරේක තොරතුරු වේ නම් ඒවාට සුදුසු ප්‍රවේශ සහ මූලාශ්‍ර පැහැදිලි කරදෙමින් ඔවුන් ස්වයං අධ්‍යනයට පෙළඹිය යුතුයි. ආකල්පය වර්ධනයේදී ගුරුවරයාගේ ක්‍රියාකලාපය සහ ආදර්ශය ඉතා වැදගත්වේ. එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තිය ප්‍රකාර ළමා අයිතීන් තහවුරු වනසේ කටයුතු කළ යුතුයි. කිසිවිටෙකත් සිසුන්ගෙන් මුදල් අයකර ඉගැන්වීම නොකළ යුතුයි.

**නිර්මාණාත්මක මග පෙන්වන්නෝ**

ගුරුවරයා සිසුන්ට මගපෙන්වන්නකු වන හෙයින් එම කාර්යයභාරය නිර්මාණාත්මකව හොඳින් ඉටු කිරීම සඳහා තම දැනුම කුශලතා සහ ආකල්ප දිනෙන් දින වර්ධනය කරගත යුතුය. ශිෂ්‍යයන්ගේ දුබලතා සහ ගැටලු පිළිබඳව විමසිලිමත් වෙමින් ඒවා විසඳා ගැනීමට ඔවුන්ට ආධාර දිය යුතුයි. ඔවුන් පිළිබඳව රහස්‍ය තොරතුරක් හෝ ගැටලුවක් වේ නම් ඒ ගැන අදාළ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට පමණක් හෙළිකළ යුතුයි. ගුරු සිසු සම්බන්ධතා අනිසි ලෙස ප්‍රයෝජනයට නොගනිමින් සිසුන් අපචාර වලට ගොදුරුවීම වළක්වාලිය යුතුයි. සෑම විටම සිසුන්ගේ දැනුම, දක්ෂතා සහ සමාජ සාරධර්ම දියුණු කිරීමට උත්සාහ දැරිය යුතුයි.

**ඇගයීම් කරන්නෝ**

දැනුම දක්ෂතා සහ සමාජ සාරධර්ම ඉගැන්වීමේදී සහ ඉගැනීමේදී ඇගයීම් අත්‍යාවශ්‍ය අංගයකි. ඉගැන්වූ/ඉගෙනගත්දේ සිසුන්ගේ සිත්තුළ ධාරණය වී ඇත්දැයි සොයා බලා එසේ නොමැති අවස්ථා වලදී ශිෂ්‍ය කේන්ද්‍රීය උපක්‍රම මගින් එම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇගයීම් ක්‍රම ගැනත් විකල්ප අධ්‍යයන ක්‍රමගැනත් ගුරුවරුන් තම දැනුම යාවත්කාලීන කරගනිමින් විනිවිදභාවයකින් හා විශ්වසනීයත්වය ගොඩනැගෙන අන්දමින් ඇගයීම් කළ යුතුයි.

**වෘත්තිකයෙක්**

ලොව පුරා සම්මානයට පාත්‍රවී ඇති ගුරු වෘත්තියේ උසස් සම්ප්‍රදායන් සහ උත්තරීතරභාවය රැකගැනීම සඳහා තම නිපුනතා යාවත්කාලීන කරගමින් ඒවා උද්යෝගයෙන් අන් අය සමග බෙදාගැනීමත් සහෝදර ගුරුවරුන්ගේ සේවා අභිවෘද්ධිය සඳහා සහාය පළ කිරීමත් තම වෘත්තීය ගැන අභිමානයෙන් සහ යහපත් හැඟීමකින් නිරන්තරයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වේ. මහජන විශ්වාසය දිනාගෙන සිසුන්ගේ අනාගත ජීවිත වල දියුණුව උදෙසා කැපවී සිසුන්, ගුරුවරුන් දෙමාපියන් සහ නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමත්, වෘත්තීය ගෞරවයට හානිකර අවස්ථා මතුවේ නම් ඒ ගැන බලධාරීන්ට දැන්වීමටත් කටයුතු කළ යුතුවේ.

**කළමනාකරණයේ වගකිවයුත්තන්**

පාසලේ කළමනාකරණ කටයුතු කාර්යක්ෂම ලෙස කිරීමටද ගුරුවරයා සහභාගීවීමට අවශ්‍යය. පාසලේ ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම, කළමනාකරණ උපදෙස් පිළිපැදීම, ගැටලු විසඳීමට සහාය වීම, තම වෘත්තීය ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලවලට ගරු කිරීම හා සියලු රාජකාරී කටයුතු විධිමත් මාර්ගවලින් සාධාරණව ඉටුකරගැනීම මීට අයත් වේ.

**සමාජයේ පෙරගමන් කරුවා**

ගුරුවරයා නිරතුරුවම තමා ජීවත්වන සමාජයේ පෙර ගමන්කරුවකු පුරෝගාමියකු වන හෙයින් සමාජ ගැටලු හඳුනාගැනීමටත් මතුවන අභියෝග වලට සාර්ථකව මුහුණුදීමටත් අවශ්‍ය නිපුණතා සහ ශක්තිය සිසුන්ට ලබාදෙමින් ඔවුන් දේශ හිතෛෂී දරුපරපුරක් බවට පත්කිරීමට උත්සාහ කළ යුතුයි. අප රටේ විවිධ ජනකොටස් අතර සාමය ගොඩනැගෙන පරිදි සිසුන් තුළ යහපත් සිතුවිලි හා සාරධර්ම ගොඩනැගීමට සෑම වේලාවම වෙහෙසිය යුතුයි. තම පාසලට, සමාජයට රටට හා ජාතියට හිතෛෂීව කටයුතු කිරීමට සෑම වේලාවකම ක්‍රියාකරමින් සිසුන්ටද ඒ මගෙහි ගමන් කරවිය යුතුයි.

මෙම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදීමෙන් වර්තමාන සහ අනාගත ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාවයත්, ඔවුන්ගේ සේවාවල ඵලදායිත්වයත් වෘත්තීය සම්මානයත් වර්ධනයවීම, එමගින් අපේ සිසු පරපුරට වඩාත් සාර්ථක අධ්‍යයන සේවා සැපයීමටත් අවස්ථා සැලසේවායැයි ප්‍රාර්ථනා කරමු

- ඉතිහාසය අධ්‍යයනය යනු ප්‍රඥාවේ ආරම්භයයි-ජීන් බෝඩීන්
- අධ්‍යාපනය ලබනතාක් මිනිසා ඔහුගේ විභවතාවයේ උච්ඡ ස්ථානයට ලඟා නොවන්නේය -හොරේෂ් මාන්
- මානව සංහතියේ සතුරා යුද්ධයම වේ. -හාවර්ඩ් සින්
- ලේඛකයකු ලෙස ඔබගේ මූලික රාජකාරිය වනුයේ ඔබව සතුටු කිරීම සඳහා ලිවීමය -අයිරිෂ් කියමනකි.
- අධ්‍යාපනය යනු වර්තමාන පරපුර විසින් අනාගත පරපුරෙන් ලබාගන්නා වූ ණයකි - ජෝර්ජ් සෝබෝඩ්
- තමා පිළිබඳව සිතීමේ අයිතිවාසිකම් සංචිතයක් සහිත මානවකයන් වන අප අරුම පුදුම සත්ව විශේෂයක් වෙමු - මර්ලින් මොන්රෝ

**එම් සී මාතුපාල මහා විසින් ලියන ලද ලිපියක් ඇසුරින් පුලුල් සමාජය සමග බෙදාහදා ගැනීම සඳහා සකස් කරන ලද්දේ කේ ඩී පීරිස් විසිනි.**

# අධ්‍යාපන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය අංගයක් වන වගවීමේ සංකල්පය

වගවීම යනු කෙනෙක් තවත් කෙනෙකු වෙත සිදුකරන උත්තර බැඳීමකි. යම් කිසි කාර්යයක නියුතු තැනැත්තා හෝ තැනැත්තිය තමන් එම කාර්ය ඉටු කරන අන්දම ගැන වෙනත් කෙනෙකු හෝ ආයතනයකට උත්තර බැඳිමට සුදානම්ව සිටිය යුතුය යන්න වගවීම සංකල්පයේ සරල අර්ථය වේ. උදාහරණයක් දක්වතොත් ප.ව 6.00 සිට පසුදා පෙ. ව. 6.00 දක්වා රාත්‍රි මුර සේවයේ යෙදෙන කෙනෙක් පසුදා උදෑසන තම හාම් පුතා වෙත තමා කරන ලද සේවය පිළිබඳ උත්තර බැඳිය යුතුය. මෙහිදි තමා එම කාලය තුළ සේවයේ යෙදී සිටියාද නැද්ද පමණක් නොව එම කාලය තුළ දූරකථන ඇමතුම් කොපමණ ලැබුණාද ඒවාට දුන් පිළිතුරු මොනවාද? වැනි රාත්‍රි කාලයේ සිදු වූ වෙනත් දේවල් පිළිබඳවද උත්තර බැඳිය යුතුය.

මේ නිසා වගවීම යනු වගකීමෙන් එහා ගිය සංකල්පයක් බව තේරුම් ගැනිම මැනවි. දේශපාලන වශයෙන් ගත් විට ප්‍රජාතන්ත්‍රවාදි රජයක් හා එහි මැති ඇමතිවරු තමා බලයට පත් කළ ඡන්ද දායකයන් වෙත මැතිවරණයට පෙර ලබාදුන් පොරොන්දු පිළිබඳව උත්තර බැඳිය යුතුය. නැතිනම් වගවිය යුතුය. එසේ නොවුන හොත් එකී මහජනතාව රජයට විරුද්ධව උද්ඝෝෂණ ආදිය සිදුකරනවා පමණක් නොව ඉන්පසුව එළඹෙන මැතිවරණයේදි පරාජයට පත් කිරිම පවා සිදුකරනු ලැබේ. ව්‍යාපාරකටයුතු වල වගවීම සිදුවන්නේද ඒ ඇසුරෙනි. යම් කිසි භාණ්ඩයක් නිෂ්පාදනය කරන බෙදාහරින හෝ සේවාවක් සපයන ආයතනයක හෝ පුද්ගලයෙක් එම භාණ්ඩයේ හෝ සේවාවේ තත්ත්වය පිළිබඳව පාරිභෝගිකයාට උත්තර බැඳිය යුතුය. නැත්නම් වගවිය යුතුය.

ඒ අනුව පාරිභෝගකයා එම භාණ්ඩයට හෝ සේවයට දක්වන කැමැත්ත අකමැත්ත මත එම ව්‍යාපාරයේ හෝ ආයතනයේ ඉදිරිගමන රඳා පවති. භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයක් තමාගේ නිෂ්පාදන භාණ්ඩ පිළිබඳ නොයෙකුත් ජනප්‍රිය නාමයක් හා ගුණයක් ඇතුලත් දැන්වීම් පළකරනු ලබන්නේ පාරිභෝගිකයා වෙත තම භාණ්ඩ හා සේවා පිළිබඳ වගවීමක් වශයෙනි. අධ්‍යාපන ක්‍රියාවලිය තුළ වගවීමේ සංකල්පය ක්‍රියාත්මක වීම පිළිබඳ එම බලධාරින් මෑතක සිට වැඩි අවදානයක් යොමුකොට ඇත. පාසලට ඇතුළත් කරන දරුවෙකුගේ අධ්‍යාපනය පිළිබඳව එහි වගකිම භාරගන්නා ආයතනය උත්තර බැඳිය යුතුය. එසේ උත්තර බැඳීමේදි විභාග ප්‍රථිඵල ගැන පමණක් නොව තවත් බොහෝ දේ පිළිබඳව ද උත්තර බැඳිය යුතුය. එනම් ළමයාගේ හැසිරිම් රටාව, සමාජ ගතවීමේ ස්වභාවය, සදාචාර වර්ධනය ආදි තවත් බොහෝ කරුණු ඊට ඇතුළත්වේ. ඕනෑම රටක අධ්‍යාපනය පිළිබඳ ජාතික අරමුණු කිහිපයක් ඉදිරිපත් කර තිබිය හැකිය. ශ්‍රී ලංකාවේ නම් දැනට එවැනි ජාතික අරමුණු අටක් ඉදිරිපත් වී ඇත. (එම අරමුණු මොනවාදැයි බොහෝ පාඩම් පොත් වල මුලින් සඳහන්ව ඇත) එකී ජාතික අරමුණු ඉදිරිපත් කර ඇත්තේ පාසලට ඇතුළත් වන දරුවකු පාසල් අධ්‍යාපනය නිමාකොට සමාජ ගතවන විට එකි අරමුණු වලට අනුගතවී හෝ එයින් පෝෂණය ලබා එයින් අපේක්ෂාකරන ආකාරයේ පුරවැසියෙකු ලෙස සමාජගත කිරිමේ වගවීම පෙර දැරිකර ගෙනය.

ශ්‍රී ලංකාවේ එවැනි ජාතික අරමුණු අටක් ඉදිරිපත් වී ඇත. (එම අරමුණු මොනවාදැයි බොහෝ පාඩම් පොත් වල මුලින් සඳහන්ව ඇත) එකී ජාතික අරමුණු ඉදිරිපත් කර ඇත්තේ පාසලට ඇතුළත් වන දරුවකු පාසල් අධ්‍යාපනය නිමාකොට සමාජ ගතවන විට එකි අරමුණු වලට අනුගතවී හෝ එයින් පෝෂණය ලබා එයින් අපේක්ෂාකරන ආකාරයේ පුරවැසියෙකු ලෙස සාමාජගත කිරිමේ වගවීම පෙර දැරිකර ගෙනය.

ඉහත කී වගවීම ඉටුකිරිම වෙනුවෙන් කොතරම් ගැඹුරු කාර්යභාරයක් ඉටුකිරිමට ඇත්ද යන්න ඔබම සිතා බැලිය හැකිය. තවද මේ වෙනුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොව ඉන් පරිභාහිරව කොතරම් පිරිසක් අවධානය යොමුකළ යුතුද යන්න ඉතා වැදගත් කරුණකි. මේ අනුව දෙමාපියන්, ගුරුවරුන් , විදුහල්පතිවරුන් , අධ්‍යාපන බලධාරින් ඇතුළු තවත් බොහෝ පිරිසක් මෙම වගවීමේ කොටස් කරුවන් බවට පත් නොවුව හොත් ඉහතකී අධ්‍යාපන අරමුණු ඉටු නොවනවාපමණක් නොව බලාපොරොත්තු වන යහපත් පුරවැසියෙක් රටට බිහිකර ගැනීමද සිහිනයක් බවට පත්වනවා නොඅවනුමානය. ශිෂ්‍යත්ව හෝ වෙනත් විභාග ප්‍රථිඵල අපේක්ෂාවෙන් තරඟයක යෙදෙන දෙමාපියන්, ගුරුවරුන් ඇතුළු සෑම කෙනෙක්ම මෙහිදි සිහිතබා ගතයුතු කරුණ වන්නේ අධ්‍යාපන බලධාරින්ගේ මෙන්ම දෙමාපියන් වන තමාගේද වගවීම ළමුන් විභාග සමත් කිරිමට වඩා එහා ගිය සුවිශේෂි කාර්භාරයක් බවයි. ශ්‍රී ලංකාවේ සිටි අධ්‍යාපනය පිළිබඳ ප්‍රවින මහාචාර්ය වරයෙකු වන ජේ.ඊ. ජයසුරිය මහතා මීට බොහෝ කලකට පෙර එතුමා විසින් පළකරනු ලැබූ ලිපියක ඉහත තත්ත්වය මැනවින් පැහැදිලි කර ඇත. එතුමා පෙන්වා දි ඇත්තේ එවකට රට තුළ පැවති නිලබලවාදී අධ්‍යාපන ක්‍රමය තුළින් ළමයාගේ විභාග ප්‍රථිඵල පමණක් මැනිය හැකි වන නමුත් එය ඉදිරි අනාගතයේදි රටට වැඩදායක කාර්යයක් නොවන බවයි. ඒ නිසා පාසලට ඇතුලත් වන ශිෂ්‍යයාගේ තත්ත්වය ගැන අධ්‍යාපනබලධාරින් ගේ මෙන්ම දෙමාපියන්ගේ ද මැදිහත්වීම අවශ්‍ය බවයි.

මේ නිසා පාසල් සංවර්ධන සමිති, පාසල් සංවර්ධන මණ්ඩල දෙමාපිය දින වැඩ සටහන්, දෙමාපිය කව පිහිටු වීම වැනි කාර්යයක් මඟින් සිදුකළ හැකි දෙමාපිය මැදිහත් වීම උපයෝගි කොටගෙන ළමයා පිළිබඳ ඉහත කී ගුණාත්මක වගවීම ගුරු දෙමාපියන් දෙපිරිසම එක්ව සිදුකිරිම සඳහා අධ්‍යාපන බලධාරින් සැලසුම් සකස්කළ යුතුව ඇත.

W. W. වෙල්ලාල (BA , Med Colombo)
**විශ්‍රාමික විද්‍යාපීඨ කථිකාචාර්ය**

# දෙමළ මාධ්‍ය උසස් පෙළ විද්‍යා,ගණිත,තාක්ෂණවේදය විෂයධාරවන්ට ඌව පළාතේ පහසුකම් අඩුයි.

ළමා අයිතිවාසිකම් පිළිබඳව එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තියේ සදහන් කරුනු ක්‍රියාත්මක කිරිමට එකි ප්‍රඥප්තියට අත්සන් තබා එකගතාවයට පැමිණි ඇති රාජ්‍යයන් ඒවා ක්‍රියාත්මක කිරිමට වගකීමෙන් බැදී සිටි. ශ්‍රී ලංකාව ද එවැනි එකගතා ගිවිසුමට අත්සන් ලබන ලද රාජ්‍යයක් වීම අප ලද භාග්‍යයක් කොට සැලකිය හැකියි. මේ නිසා මෙම ගිවිසුමට අත්සන් තබා ඇති රාජ්‍යයන් තුල ජීවත්වන සියලු ළමුන්ට සමානව අයිතිවාසිකම් හිමිවනු ඇතැයි අපි අපේක්ෂා කරමු. එම ලියවිල්ලට අනුව වගන්ති 45ක් හදුන්වා දෙමින් එකිනෙක විස්තර කරමින් පැහැදිලි කර ඇත. ප්‍රධාන කොටස් හතරකට එම වගන්ති ඇතුලත් කරමින් විශ්වයේ ජීවත්වන සෑම ළමයකු සදහාම සම අයිතියක් ළබා දිමට එක්සත් ජාතින් විසින් ගෙන ඇති ක්‍රියාව ඉතාම වැදගත්වේ. සහභාගිත්වය,ආරක්ෂාව,සංවර්ධනය,පැවැත්ම එම ප්‍රධාන කරුණු හතර මැනවන් එම විශ්ව ප්‍රකාශනයේ පැහැදිලි කර ඇත.

එහි දෙවන වගන්තිය මෙසේ සදහන් කර ඇත. ළමයින් කවුරු වුවද කුමන වයසක වුවද කිසියම් ආබාධයක් සහිත වුවද,කුමන වර්ණයකින් යුක්ත වුවද,කුමන ජාතියකට හෝ ආගමකට අයත්වුවද කුමන භාෂාවක් කතාකළද ඒ සැමටම මෙහි සදහන් සියලු අයිතිවාසිකම් හිමිය. සෑම ළමයෙකුටම වෙනස්කම් නොකිරිමට රජය වග බලා ගත යුතු අතර. ළමා අයිතින් ක්‍රියාත්මක කිරිමේ අයිතියද රජය සතුය.

28 වන වගන්තියේ අධ්‍යාපන පිළිබඳව මෙසේද සදහන්ව ඇත. අධ්‍යාපනය ලැබිමට සියලුම ළමයින්ට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්යකිරිමටත්,එය නෙමිලේ ලබාදීමට කටයුතු කිරිමේ රජයේ වගකීම වනු ඇත.

29 වන වගන්තිය අධ්‍යාපනයේ අරමුණු අධාපනයේ පරමාර්ථවනුයේ ළමයාගේ පෞරුෂත්වය,දැනුම,කුසලතා,සහ මානසික ශාරිරික හැකියාවන් පරිපුර්ණ ලෙස වර්ධනය කිරිමයි. වගකීමෙන් සාමකාමිව නිදහස් සමාජයක ජීවත්වීමටද අනිත් පුද්ගලයින් ගේ අයිතිවාසිකම් වටහා ගෙන පරිසරයට ගරු කරමින් ජීවත් වීමටද අධ්‍යාපනය තුලින් ළමුන් සුදානම් කළයුතු බවට රජය විසින් පිළිගෙන තිබේ.

මේ වන විට ඌව පළාතේ දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ හදාරන සිසුන්ට බලවත් අසාධාරණයක් සිදුවෙමින් පවති වසර ගණනාවක්ම මේ ළමුන් මෙම අවසානවන්ත සිද්දියට මුහුන පා සිටි. සංහිදියාව පිලිබදව අප කතාකරනවා. ජාත්‍යන්තරයට සංහිදියාව පිලිබදව අපි පාඩම් කියා දෙන රටක් බවට පාලකයින් විසින් මාධ්‍ය සංදර්ශන පවත්වනවා. විවිධත්වයට ගරු කිරිමට නම් සියලු ජනවර්ගවලට සමානව සැලකිය යුතු බවට ජාත්‍යන්තර ලියවිලි වලට එකවි සිටිනම් එවා ක්‍රියාත්මක කිරිමේ වගකීම එම රාජ්‍ය වගකීම වන්නේය.ඒවා කඩ කරණ රාජ්‍යයන්ට එරෙහිව කටයුතු කිරිමටද ජාත්‍යන්තරයට හැකියාව ඇත.

ඌව පළාතේ මුලු ජනගහනයෙන් 24.1% ශ්‍රී ලංකා දෙමළ සහ ඉන්දියානු දෙමළ වශයෙන් මේ රටේ පුරවැසියන් ලෙස ජීවත්වීම ඌව පළාතේ විවිධත්වය විචිත්‍රවත් කරයි. මේ ජනතාව වැඩි වශයෙන් වතුකරයේ සේවය කරමින් වතුකරයේ ජීවත්වන අඩු වැටුපක් ලබන පවුල් වන අතර මේ අතරින් ඉහල ආදායමක් ලබන මධ්‍යම පංතිය මෙන්ම සුපිරි ධනවත් පංතිය නියෝජනය කරණ පවුල්ද ඌව පළාතේ ජීවත්වේ. කොහොම නමත් වතුකරයේ ජීවත්වන අඩු ආදායම් ලාභි පවුල් ළමුන් ගේ දෙමළ මාධ්‍ය අධ්‍යාපනය මෙන්ම ඌව පළාතේ සමස්ත දෙමළ මාධ්‍ය උසස් පෙළ විද්‍ය ගණිත සහ තාක්ෂණවේදය විෂයධාරාවන් හැදැරිමට අවශ්‍ය පුහුණු මානව සම්පත් අඩුවක්ව පවති. මේ පිළිබදව ඌව පළාත් සභාවේ අධ්‍යාපන ඇමැති චාමර සම්පත් දසනායක මහතා මෙවැනි ප්‍රතිචාරයක් දක්වයි. ඌව පළාතේ දෙමළ මාධ්‍යයෙන් උසස්පෙළ විද්‍ය ගණිත හා තාක්ෂණවේදය විෂයධාරාවන් ඉගැන්විම පිලිබදව ගුරු හිගයක් පවතිනවා. මෙම තත්වය මේ කෙටි කාලයක් තුල ඇතිවු ප්‍රතිපලයක් නොවේයි. මේක දිගුකාලින සැලස්මකට අනුව ක්‍රියාත්මක නොවිමේ ප්‍රතිපලයක් මේනිසා අද වසේ එම විෂයධාරාවන් ඉගෙන ගැනිමට සිටින දරුවන් විශාල ගැටලුවකට මුහුණ පාසිටිනවා. පසුගිය කාලය තුල මේ රටේ ආණ්ඩුකළ සියලුම දේශපාලන නායකයින් මෙහි වගකීම භාරගතයුතු වෙනවා. ඒ වගේම මෙම ජනතාවගේ ඡන්දය ලබාගෙන බලයට පත්වු දෙමළ දේශපාලන නායකයින් ද ප්‍රධන වශයෙන් වගකීම භාරගතයුතු වෙනවා. මේ වන විට මධ්‍යම රජයෙන් පාලනය වන පාසැල් මෙන්ම ඌව පළාත් සභාවෙන් පාලනය වන පාසැල් වල මෙම ගුරු හිගය ඇඩි පවතිනවා. පළාතක් වශයෙන් මේ සදහා විවිධ පියවරවල් ගත්තත් මෙතෙක් එය සාර්ථක වුනේ නැහැ. රාජ්‍ය සේවයට බදවා ගැනිමේ ප්‍රතිපත්තියක් තියනවා ඒ අනුව අපි පළාතෙන් සුදුසුකම් ඇති අයට ඉදිරිපත්විමට අවස්ථාව ලබාදුන්නා. සාර්ථකවුනේ නැහැ. ජාතික මට්ටමින් අවස්ථාව ලබාදුන්නා සාර්ථක වෙලා නැහැ විශ්‍රාමික සුදුසුකම් ඇති අයට අමතර දීමනාවක් විශ්‍රාමික වැටුපට එකතු කරලා සුදුසුකම් ඇති අය බදවා ගැනිමට පියවර ගෙන තිබනවා.මේ සදහා මධ්‍යම රජයත් වගකීම භාරගතයුතුයි. ඒ අනුව මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමැතිවරයාට හා ජනාධිපති වරයාට අගමැති වරයාට දැනුම් දි තිබනවා.

දෙමළ මාධ්‍ය අධ්‍යාපනය භාර ඌව පළාතේ අධික්ෂණ මන්ත්‍රිවරයා මෙසේ පැවැසීය.

වතුකරයේ හොද තත්වයේ පාසැල් නොවෙයි පෙර පාසැලක්වත් නැහැ.බොහොම අපහසුතා මධයේ තමයි අධ්‍යාපනය ලබන්නේ. ඌව පළාතේ පවතින පුරප්පාඩු සදහා උතුරු නැගෙනහිර පළාත්වලින් සුදුසුකම් ඇති ගුරුවරුන් බදවා ගැනිමට විවිධ ක්‍රම සකස්කළත් ඒ පළාත්වලින් ඌව පළාතට පැමිණිමට කැමැති නැහැ. වියදම් අධිකයි. ඌව පළාතේ මුස්ලිම් ළමුන්ද අධ්‍යාපනය ලබන්නේ දෙමළ මාධ්‍යයෙන් මේ අයටත් මේම අසාධාරණය සිදුවෙලා. මේවන විට මෙය ජාතික ගැටලුවක් වෙලා.ඌව පළාතේ දෙමළ මාධ්‍යයන් උසස් පෙළ විද්‍යව,ගණිතය හා තාක්ෂණවේදය පිලිබදව අධ්‍යාපනය ලැබිමට නුවරඑළියට හෝ මඩකළපුවට යන්නට ඕනේ. පසුගිය කාලයේ සිදුවු විභාග වංචා කටයුතු හේතුවෙන් එම අවස්ථාවත් අපේ දරුවන්ට අහිමිවි ගියා. මේඅනුව ඌව පළාතේ කිසිදාක විද්‍යව,ගණිත හා තාක්ෂණවේදය විෂයධාරාවන්ගේ ඉගනගත් විශේෂඥයින් බිහිනොවන්ට ඉඩ තිබනවා. සංහිදියාව ගැන කතාකරණවා මේකද සංහිදියාව.

ඌව පළාත් සභා මන්ත්‍රි සමන්ත විද්‍යාරත්න මහතා මේ පිළිබදව මෙසේ අදහස් දැක්වුවා.

ඌව පළාතේ වතුකයේ ජීවත්වෙන දරුවන් බොහෝම අමාරුවෙන් සාමාන්‍ය පෙළ සමත් වෙලා උසස්පෙළ හැදැරිමට සුදුසුකම් ලබාගෙන තමන් කැමැති විෂයධාරාවන්ගෙන් උසස් පෙළ හැදැරීමට ඌව පළාතේ පහසුකම් නැහැ. නමුත් නිදහසින් පසු මේ රටේ දෙමළ මාධ්‍ය උගතුන් වැඩි වශයෙන් බිහිවි තිබනවා.ඒ අනුව එදා අධ්‍යාපනයේ ගුණාත්මක තත්වයක් මෙන්ම මේ සදහා පහසුකම්

තිබුන බව පැහැදිලියි. අද එම තත්වය ඌව පළාතේ නැතිවී යනවා.මේ සඳහා මෙතෙක් මෙමරට පාලනය කළ එමෙන්ම ඌව පළාත් සභාවේ නියෝජනය කළ දේශපාන නායකයින් වගකිව යුතු වෙනවා.පළාතේ මුදල් ඇති අය වෙනත් පළාත්වලට යවලා ළමයා කැමැති විෂයධාරාවකින් උසස් පෙළ හැදැරිමට අවස්ථාව ලබා ගන්නවා.වැඩි පිරිසකට එම අවස්ථාව නැහැ. අඩුම තරමින් මෙම විෂයධාරවන්ට අමතර පංති පැවැත්වෙන්නේත් නැහැ. බදුල්ල නගරයේ පිහිටි දෙමළ මාධ්‍යය ජාතික පාසැලේවත් මෙම විෂයධාරාවන් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් පත්කිරිමට මධ්‍යම රජය අපොහොසත්වෙලා.ඌව පළාතේ දෙමළ මාධ්‍ය පාසැල් 205 ක් තියනවා. මේ අතරින් සාමාන්‍ය පෙළ දක්වා ඉගැන්වෙන පාසැල් ගණන 83 යි. ඒ අතරින් උසස් පෙළ ඉගැන්වෙන්නේ පාසැල් 45ක පමණයි. ඒ අතරින් විද්‍යව, ගණිතය සහ තාක්ෂණවේදය විෂයධාරාවන් උසස් පෙළට උගන්වන පාසැල් ඇත්තේ 11යි. නමුත් මේ පැසැල් 11 ට අවශ්‍ය ගුරුවරුන් නැහැ. 2015 වර්ෂයේ සාමාන්‍ය පෙළ විභාගය සදහා ළමුන් 2682ක් ඉදිරිපත් උනා.1306 ක් සාමාන්‍ය පෙළ සමත්වෙලා උසස් පෙළ හැදැරිමට සුදුසුකම් ලැබුවා. නමුත! මේ ළමුන්ට අවශ්‍ය විෂයධාරාවෙන් උසස් පෙළ හැදැරීමට අවස්ථාව ලැබුනේ නැහැ.මේ ළමුන් දෙමළ මාධ්‍ය නිසාම මේ අයට අසාධාරණයක් වෙලා මේ අනුව එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය උල්ලංගනය වෙලා. මෙම විෂයධාරාවන් තුනම මේවන විට ආරම්භ කර ඇත්තේ බ/සරස්වති විද්‍යාලය පමණයි.මේ විද්‍යාලයේ උසස් පෙළ පන්ති හයක් ආරම්භ කර තිබනවා නමුත් ගුරුවරුන් තිදෙනක් පමණයි සේවය කරන්නේ.මේ තත්වය අනුව දෙමළ මාධ්‍යයෙන් අනාග යට බිහිවිය යුතු මානව සම්පත ඌව පළාතට අහිමිවී යෑම සංහිදියාවට මෙන්ම විවිධත්වයට විශාල බාධාවක් වනු ඇත.

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය

## තිරසාර සංවර්ධන අරමුණු අංක 4 පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරනු ලබයි



පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේදී පැවැති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක නායකයින් ජගත් මානව ප්‍රජාවේ සුභසාධනය වෙනුවෙන් සකසන ලද්දාවූ තිරසාර සංවර්ධන අරමුණු පිළිගැනීමටත් ඒ අරමුණු දිනාගැනීම සඳහා කටයුතු කිරීමටත් එකගත්වය පළකළහ. මෙම තිරසාර සංවර්ධන අරමුණු එකිනෙක හා බැඳුනු අරමුණු 17 කින් සහ ඉලක්ක 169 කින් සමන්විතය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ මැදිහත්වීම යටතේ ලෝකයේ රටවල් තිරසාර සංවර්ධන අරමුණු න්‍යායයපත්‍රය කරා එලැඹුනේ වසර 2000 සිට 2015 දක්වා ක්‍රියාත්මකවූ සහශ්‍ර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය පිළිබඳව සිදුකරන ලද සමාලෝචනයකින් අනතුරුවය. නව තිරසාර සංවර්ධන අරමුණු මෙම අරමුණු එකිනෙකට සුවිශේෂී මෙන්ම එකිනෙකා හා බද්ධවී තිබෙන අතර ඒවා දිනාගැනීම සඳහා වඩාත් පුලුල් මට්ටමේ ප්‍රවේශයක් අවශ්‍යවේ. මේ අනුව මෙම අරමුණු දිනාගැනීමේදී රාජ්‍ය අංශය රාජ්‍ය නොවන අංශ සහ පෞද්ගලික අංශය ඇතුලුව සමාජයේ සියලු කොටස් සහ පුද්ගලයන් මේ සම්බන්ධයෙන් දැනුම්වත් වීමත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මකවීමත් ඉතා වැදගත්වේ. ශ්‍රී ලංකා රජය මෙම අන්තර්ජාතික සම්මුතිය ක්‍රියාවට නැංවීම සඳහා පියවර ගනිමින් සිටී. තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීමේ දී වැදගත්වන්නාවූ ක්‍රමෝපායික වැඩසැලසුම් සකස් කිරීම ආයතන අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට 2015 සැප්තැම්බර් මාසයේදී තිරසාර සංවර්ධන සහ වන ජීවී අමාත්‍යාංශය පිහිටුවන ලැබිණි.

දැනට ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධනය සඳහා වූ ආසියානු හා පැසිෆික් කළාපීය සම්මේලනයේ සභාපතිත්වය දරණු ලබනු අතර මෙම කළාපයේ තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියාකරමින් සිටී. තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා ප්‍රතිපත්ති හා උපායය මාර්ග සැකසීමට අදාළ පනතක් නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම පනත මගින් අමාත්‍යාංශ, පළාත් සභා ප්‍රාදේශීය සභා ඇතුලු සියලුම රජයේ ආයතන වලට තිරසාර සංවර්ධන උපායය මාර්ගයන් සැකසීමටත් තිරසාර සංවර්ධන ප්‍රමිතීන්, මාර්ගෝපදේශය සහ දර්ශක වලට අනුව විමර්ශන සහ ප්‍රගති වාර්තා සැකසීම අනිවාර්යය වනු ඇත. තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය සිලුදෙනාම අන්තර්ග්‍රහණය වූ පරිනාමනයක් යන්න තේමා කොටගෙන තිරසාර සංවර්ධන මාර්ග සිතියමක් සකස් කිරීමේ කාර්යයයේ නියැලී සිටී. තිරසාර සංවර්ධන අරමුණු යටතේ දැක්වෙන ඉලක්ක 169 දිනාගැනීමේදී එක් එක් ආයතනයේ කාර්යයභාරය වගකීම් හඳුනාගැනීමේ හා ඒවායේ ධාරිතාවන් ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේ. කෙසේවෙතත් තිරසාර සංවර්ධන අරමුණු හා ඒවා දිනාගැනීමට පවතින වැඩපිළිවෙල ගැන මෙන්ම පුද්ගලිකව ඒ වෙනුවෙන් කළයුතු කැපවීම සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව තුළ පමණක් නොව මේ සම්බන්ධයෙන් මූලික වගකීම් දරණ රාජ්‍ය නිලධාරීන් තුළ පවා පැහැදිලි

අවබෝධයක් නොතිබෙන බව අනාවරණය වී තිබේ.



මෙම තත්වයට යම් විසඳුමක් ලබාදීම සඳහා තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳවත් විශේෂයෙන්ම අධ්‍යාපනික අරමුණ පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීමටත් අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 18 ක පවත්වන ලදී. මෙම වැඩසටහන් සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සිදුකරන ලද්දේ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ නිලධාරීන් විසිනි. මෙහිදී අදාළ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන වල සහායද ඔවුන්ට හිමිවිණි.

එක් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සඳහා ගුරුවරුන් සහ දෙමාපියන් 30 දෙනකු බැගින් සහභාගී වූ අතර ඔවුන් අතර පළාත් අධ්‍යාපන බලධාරීන්, විදුහල්පතිවරුන් මෙන්ම මාධ්‍යවේදීන්ද සිටියහ. මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් වලදී සහශ්‍ර සංවර්ධන අරමුණු වල සිට තිරසාර සංවර්ධන අරමුණු කරා පරිනාමනය වූ ක්‍රියාවලිය පිළිබඳව සහභාගිකයින්ට මනා අවබෝධයන් ලබාදීමට කටයුතු කරන ලදී. විශේෂයෙන් අධ්‍යාපන අරමුණ අංක 04 සියලුදෙනාම අන්තර්කරණය වූ සමානත්වයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා හා අධ්‍යාපන අයිතිය තහවුරු කරලීම සඳහා සිවිල් පුරවැසියන්ගේ සහ සංවිධාන වල මැදිහත්වීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කරන ලදී.

මේ අනුව දැනුම්වත් කිරීමේ වැඩසටහන් වල මූලික අරමුණු පහත දක්වෙන ආකාරයට සාරාංශ ගතකළ හැකිය.

- තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුම්වත්භාවය ඉහළ නැංවීමත් අදාළ අංශ සඳහා වූ විශේෂ සැලසුම් ක්‍රියාවට නැංවීමේදී කොටස් කරුවන් බවට පත්වීමට ඔවුන් උනන්දු කරවීම
- අපගේ පාර්ශව සංවිධාන වල ධාරිතාවන් ශක්තිමත් කිරීම සහ ඔවුන් අධ්‍යාපන ක්ෂේත්‍රය සමග පවත්වන්නාවූ සම්බන්ධතාවන් තවදුරටත් ශක්තිමත් කිරීම
- අදාළ ප්‍රදේශයන්හි අධ්‍යාපනය සම්බන්ධයෙන් පවත්නා ගැටලු හඳුනා ගැනීම සහ ඒවා විසඳාගැනීමට ක්‍රමෝපායයන් හඳුනා ගැනීම

අදාළ ප්‍රදේශයේ අධ්‍යාපන බලධාරීන්ද මෙම අවස්ථාවට සහභාගී බැවින් පළාතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන් හා ඍජුව අදහස් හුවමාරු කරගැනීමට කදිම අවස්ථාවක් මෙමගින් උදාවූ බව මෙම වැඩසටහන පිළිබඳව අදහස් දක්වමින් සහභාගිකයින් පවසා සිටියහ. එමගින් සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියේ අරමුණු සම්බන්ධයෙන් තුලනාත්මක විවරණයක් සහභාගිත්ව ප්‍රවේශයක් ඔස්සේ සිදුකිරීමට හැකිවූ බවට සහභාගිකයින් අදහස් දක්වූහ. එමෙන්ම තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීම සාමූහික ක්‍රියාවලියක් බවත් මෙම අරමුණු එහිදී තමන්ට විවිධාකාරයෙන් විවිධවූ මට්ටම් වලින් දායකත්වය ලබාදීමට හැකියාව ඇති බවට සහභාගිකයින්ට අවබෝධ කරලීමට මෙම වැඩමුලුව සමත්විය.





**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
අංක 439/6A සුදර්ශන මාවත. නාවල පාර, රාජගිරිය
Web: cedsrilanka.net
දුරකතනය : 0112887642